# හේතුවක් නැති මරණයකට.. හේතුව ආදරය ම බව කිවූ ඔහු

විශේෂ පාස්කු ප්‍රකාශනය

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මෙහෙවරකි

වර්ෂ 2024 ක් වූ මාර්තු මස 29 වෙනි සිකුරාදා





## ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානවීම කිතුනුවන්ගේ විශ්වාසයේ පදනමයි.

**අති උතුම් හැරල්ඩ් ඇන්තනී පෙරේරා**
**රදගුරු හිමිපාණෝ**
සභාපති, ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය.
වයඹ පළාත්-කුරුණෑගල කතෝලික රාජගුරුප්‍රසාදීන් වහන්සේ

පාස්කු මංගල්‍යය කිතුනු ශ්‍රාවකයාගේ ප්‍රධානතම සහ උතුම්ම මංගල්‍යයයි. එයට හේතුව ක්‍රිස්තුස් වහන්සේ මරණය පරාජය කර උත්ථානය වී මිනිස් සංහතිය පාපයෙන් එතෙර කිරීමයි. ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානවීම කිතුනුවන්ගේ විශ්වාසයේ පදනමයි. ශුද්ධ වූ පාවුලු තුමා සඳහන් කරන අයුරින් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන නොවූ සේක් නම්, අපට දෙසන්නට ධර්මයක් නැති වග ස්ථිරය.


උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේ තම ගෝලයන්ට ගෙන ආ ප්‍රීතිය, සතුට අපට ද ලැබෙන අතර, උන්වහන්සේ නිරතුරුවම අප සමඟ සිටින බව ද, අපගේ විශ්වාසයයි." ලෝකාන්තිමය දක්වා මම ඔබ සමඟ සිටිමි" යි උන්වහන්සේ වදාළ සේක.

2024 වර්ෂයේ මෙවර අප පාස්කු මංගල්‍යය පවත්වන්නේ ආර්ථික ප්‍රශ්න මධ්‍යයේය, මැතිවරණ පිළිබඳව කතිකාවක් ගොඩනැගෙන වටපිටාවක් තුළය. එපමණක් නොව මිලේච්ඡ පාස්කු ඉරුදින ප්‍රහාරයේ පස්වන සංවත්සරය ආසන්නයේ දීය. තවමත් ඒ මිලේච්ඡ ප්‍රහාරයෙන් වින්දිතයින්ට සාධාරණය ඉටුවනු දැක්ම සඳහා මහත් ආයාසයකින් හා බලාපොරොත්තුවකින් අපි මොරග සන්නෙමු.

ආර්ථික ප්‍රශ්නය හමුවේ ජනතාවට තවම සතුටු විය හැකි තත්ත්වයක් උදාවී නොමැත. දෛනික ජීවිතයේ විවිධ අරගලයන්ට මුහුණදෙමින් එක වේලක් හෝ සොයාගැනීමට දහදිය හෙළන පවුල්වලට සැනසීම හා විසඳුම් ලැබෙන ලෙස දෙවිඳුන්ට අඛණ්ඩව කන්නලව් කරමු. අප එසේ කරනු ලබන්නේ අප මැවුම්කාර දෙවි සමිඳාණන් කෙරෙහි අප තුළ ඇති අචල විශ්වාසය නිසාත්, උන් වහන්සේ හැර අපට වෙනත් සරණක් නැති නිසාත්ය.

ශුද්ධ වූ පේදුරු අපෝස්තුළුතුමන්ගේ වචන අපි අපේම කර ගනිමු." ස්වාමිනී. අප කවරෙකු වෙතට යන්නද? සදාතන ජීවනයේ වචන ඇත්තේ ඔබවහන්සේ වෙතය." (ශු.ජොහාන් 6:68)

උත්ථානවූ ක්‍රිස්තුස් වහන්සේගේ බලගතු ආශිර්වාදයෙන් යුත් පාස්කු මංගල්‍යයක් ඔබ සැමට ප්‍රාර්ථනා කරමි !



**අති උතුම් මැක්ස්වෙල් සිල්වා**
**සහයක රදගුරු හිමිපාණෝ**
සභාපති, ජාතික කතෝලික සන්නිවේදන කොමිසම.

## ඔබ සැමට උත්ථාන වූ ස්වාමින් වහන්සේගේ ආශිර්වාදය ලැබේවා.

මෙදා පාස්කුව වෙනුවෙන් නිකුත් කරන විද්‍යුත් පාස්කු ප්‍රකාශනයට පණිවුඩයක් නිකුත් කිරීමට ආරාධනා කිරීම ගැන මම ස්තුතිවන්ත වෙමි. පාස්කුව යනු කිතුනුවන්ගේ උත්තරීතර මංගල්‍යයි. අප ගැලවුම්කාරයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථානය සිහිපත් කෙරෙන පාස්කු මංගල්‍යය සැබවින්ම ලොව දසත විසිරී පැතිරී සිටින කිතුනුවෝ සතුටු සිතින් ගෞරව පූර්වකව සමරති. පාස්කුව නිසා අද ශුද්ධවූ සභාවත්, ක්‍රිස්තුස් වහන්සේගේ දහමත් ජීවමානව පවතතින බව අපි සිහිපත් කළ යුතු වෙමු.

අද සමාජය තුළ කිතුනු ජනතාව වන අප සැමට විවිධ කුරුසියන් කරතබා ගෙන යාමට සිදුවන අවස්ථා එමටය. එදා ක්‍රිස්තුස් වහන්සේ අපගේ ගැලවීම උදෙසා කුරුසිය භාර ගත්තාක් මෙන් අපිද අපගේ ජීවිත කුරුස සතුටු සිතින් භාර ගෙන ඒවා ජය ගැනීමට මේ පාස්කුවේ දී උත්සහ කරමු. එසේ ජීවිත කුරුස හමුවෙන තරමට, ඒවාට හොඳින් මුහුණ දෙන ආකාරයට කිතුනුවන් වන අපි ක්‍රිස්තුස් වහන්සේට මේ චාතාරිකයේ ළංවෙමු. අපගේ පිවිත ඇද වැටීම් හමුවේ ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසියේ ගමන සිහිකරමින් වඩ වඩාත් ශක්තිමත් වෙමු.

සෑම වසරකම පාස්කු කාලය තුළ ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව විවිධ ආකාර කටයුතු සංවිධානය කරති. අපි ඒවා ගැන ආඩම්බර වන අතර, මෙම පාස්කුවේ දී එළිදක්වන විද්‍යුත් පාස්කු ප්‍රකාශනය සාර්ථක වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

ඔබ සැමට සුභ පාස්කු මංගල්‍යයක් වේවා!



## දෙවියන් වහන්සේගේ ආදරය, වරප්‍රසාදයේ ජීවිතයට එතෙර වීමයි.

**ගරු. ජූඩ් ක්‍රිශාන්ත ප්‍රනාන්දු පියතුමා**
ජාතික කතෝලික ජනසන්නිවේදන අධ්‍යක්ෂ

පාස්කුව කියල කියන්නේ එතෙර වීමක්. එදා ඊශ්‍රායල් ජනතාව දෙවියන් වහන්සේ පොරොන්දු වුණු කිරියෙන් පැණියෙන් උතුරන දේශයට යන්නට පිටත් වුනු මංකඩ තමයි ඒ රතු මුහුද. මෙන්න මේ කඩ ඉමත් සමඟ තමයි ඔවුන්ගේ වහල්භාවයෙන් නිවහල් භාවයට එතෙර වීම කියලා ඊශ්‍රායල් ඉතිහාසයේ සනිටුහන් වෙන්නේ. මෙය භෞතික එතෙර වීමක්. යකාගේ වහල්භාවය කියන පාපය තුළ ජීවත්වෙන අය වශයෙන් දෙවියන් වහන්සේගේ ආදරේ වරප්‍රසාදයේ ජීවිතයට එතෙර වීම කියන පාස්කුව අද අපි සමරනවා. ඒක තමයි අද අපේ පාස්කුවේ නියම

6 පිටුවට >>>



**සුජිතාර් සිවනායගම් දේව ගැතිතුමා**
මහලේකම්
ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

පාස්කු මංගල්‍යය මනුෂ්‍යයන්ගේ හදවත් තුලට නව බලාපොරොත්තුව ගෙන දෙමින් ජීවිත පරිවර්තනයකට කැඳවන ක්‍රිස්තුස් වහන්සේගේ බලය ලොවට ප්‍රකාශ කෙරෙන දිනයකි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණයෙන් උත්ථානය වීම සිහිපත් කරන මෙදින විමුක්තිය සහ සාමය තුළ කටයුතු කිරීම වැදගත් වේ.

එමෙන්ම, වර්තමානයේ ශ්‍රී ලංකා දේශයේ පවතින දේශපාලනික, ආර්ථික, සමාජීය අර්බුද හමුවේ වැටී සිටින අපි, මේ පාස්කුවේ ජේසුස් වහන්සේගේ නැවත නැගිටීම කරණකොටගෙන මේ අර්බුදයන්ගෙන් නැවත නැගී සිටීමට උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය සහ කරුණාව ලැබෙන, ශ්‍රී ලංකාවාසී සියලුම ජනතාවට අර්ථාන්විත පාස්කු මංගල්‍යයක් වේවා යැයි ප්‍රාර්ථනා කරමි.



**රනිල් වික්‍රමසිංහ**
**ජනාධිපති**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## උත්ථානයේ ගමනේ ආශිර්වාදයත් සමඟින් අප නැවත නැඟී සිටිය යුතුය.

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින් නපුර පරදා උත්ථානය ලැබූ අවස්ථාව සිහිපත් කරමින් ලොව පුරා වෙසෙන කිතුනු ජනයා පාස්කු මංගල්‍යය සමරති.


ජේසුස් වහන්සේගේ දුක් විඳීම, මරණය සහ උත්ථානය සිහිපත් කරමින් දින 40 ක චතාරික සමය ගෙවන කිතුනු බැතිමතුන් උපවාසයේ නිරත වෙමින් සහ ආගමික වතාවත් වල නිරත වෙමින් පාස්කු මංගල්‍යයට එක්වෙති.

ඉතිහාසයේ දරුණුතම ආර්ථික අභියෝගය හමුවේ රටක් ලෙස අප සියලු දෙනා ද මහත් පීඩාවකට පත් වූයෙමු. එහෙත් දරාගත හැකි ජාතියක් ලෙස ඒ උත්ථානයේ ගමනේ ආශිර්වාදයත් සමඟින් අප නැවත නැඟී සිටිය යුතුය.

බහුවාර්ගික සමාජයක් ලෙස ජීවත්වන අප අද රට ඉදිරියේ ඇති අභියෝග ජය ගැනීම වෙනුවෙන් එකමුතුව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ. එබැවින් ශ්‍රී ලාංකිකයන් ලෙස අපගේ එකමුතුකම සහ සංහිඳියාව ප්‍රවර්ධනය කළ යුතු අතර ඊට කැළලක් ඇතිකරන කිසිඳු ආකාරයේ කුමන්ත්‍රණයකට හසු නොවී බුද්ධිමත්ව රටේ ආරක්ෂාව, සාමය සහ සංවර්ධනය වෙනුවෙන් කැපවීම සියලු දෙනාගේ යුතුකමකි.

ශ්‍රී ලාංකේය කිතුනු ජනතාව අසීමිත ගෞරවයෙන් සහ භක්තියෙන් සමරනු ලබන පාස්කු සමය අන්තවාදී මිලේච්ඡ ප්‍රහාරයකට වරෙක ගොදුරු විය. එම අඳුරු මතකය කිසිදා අප හදවත් තුළින් මැකී නොයන අතරම, ඊට වගකිව යුත්තන්ට එරෙහිව නීතිය ස්වාධීනව හා අපක්ෂපාතීව ක්‍රියාත්මක කිරීමට රජය අවකාශ සලසා දී තිබෙන බවත්, එවන් ඛේදවාචකයක් නැවත රට තුළ ඇති වීමට කිසිඳු ඉඩක් නොතබා ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට රජය කැපවී සිටින බවත් සිහිපත් කරනු කැමැත්තෙමි.

සියලු කිතුනු ජනතාවට ආශිර්වාදාත්මක හා ප්‍රීතිමත් පාස්කු මංගල්‍යයක් වේවායි ප්‍රාර්ථනා කරමි.



**දිනේෂ් ගුණවර්ධන - අග්‍රාමාත්‍ය**
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයෙන් අප ජීවිත ආලෝකමත් කර ගනිමු.

වත්මන්, සංකීර්ණ සමාජ අනවබෝධයන් හමුවේ මානව සබඳතා සහ සමාජ ධර්මතා කෙරෙහි අවධානය යොමු කරමින් සමාජය නිවැරදි මගට ප්‍රවිෂ්ට කිරීමට මේ පාස්කු දිනයේදී අදිටන් කර ගනිමු. මිනිස් ජීවිතයක මෙවන් කාරණා කෙරෙහි සංවේදී වීම හා සැමරීම සමාජයේ යහ පැවැත්ම උදෙසා දායක වෙයි.

මානවයා පාපයෙන් ගලවා, සමාජ සාධාරණය, දයාව, ප්‍රේමය, මනුෂ්‍යත්වය වෙනුවෙන් තම ජීවිතය කැප කළ ජේසුස් ක්‍රිස්තුස් විමුක්තියේ නව මඟ පෙන්වා දුන් බව ක්‍රිස්තු භක්තික විශ්වාසයයි.

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය ආදර්ශයට ගනිමින් නොපසුබට උත්සාහයෙන් ධෛර්යවන්තව යහපත් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පෙළ ගැසෙමු. කුමන අර්බුදකාරී තත්ත්වයක් තුළ වුවද ඒ සඳහා අවැසි මානසිකත්වය අප තුළ ජනිත කර ගැනීමටත් ආගමික ඉගැන්වීම් අපට පිටිවහලක් වෙයි.

වධකයන්ට සමාව දී දයාව හා ප්‍රේමයේ පතුරුවාලු ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් අපගේ හදවත් නවමු පරිවර්තනයකට ගෙන යමින් දයාකාරුණික ප්‍රේමයෙන් හා සමාව දීමේ ගුණයෙන් මෙවර පාස්කුව සරසමු.



**විදුර වික්‍රමනායක - අමාත්‍ය**
බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## ප්‍රේමයේ අනුහස් ලොවට බෙදා දීමට හැකි සුභ පාස්කු මංගල්‍යයක් වේවා.

දේව පාලනයක් සහිත යුගයක් හෙවත් ප්‍රේමයේ පාලනයක් සහිත යුගයක්,නව අහසක් නව පොළවක් උදාකර ගැනීමට අප පවතින මේ ලෝකය තුළ සිටියද මේ ලෝකයේ දූ පුතුන් නොවී ආලෝකයේ දූ පුතුන් වීම අත්‍යාවශ්‍ය වේ. මිනිස් ජීවිතයට විමුක්තිය ලබාදුන් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දුක්විඳීම, මරණය සහ උත්ථානය සිහි කරමින් සකල ලෝකවාසී කිතුනු ජනතාව පාස්කු මංගල්‍යය සමරනු ලැබේ. කිතුනු විශ්වාසයට අනුව උන්වහන්සේ මරණයෙන් නැගිටීම එනම් උත්ථානය සිදුව ඇති දිනය පාස්කු ඉරිදා ලෙස හැඳින්වේ.

ශ්‍රී ලාංකිකයින් වශයෙන් වැටී තිබෙන රට ගොඩනැගීමට වෙර දරන අවස්ථාවක මුහුණ පා ඇති තත්වයන්ට සාර්ථකව මුහුණ දීම සඳහා එකිනෙකාට ප්‍රේම කිරීම හා ගෞරව කිරීම අප සැම දෙනාටම ඉමහත්වූ ශක්තියක් වනු ඇත. දේශයක් වශයෙන් නැගී සිටීමටත් මිනිසුන් වශයෙන් සාමකාමී වටපිටාවක සහජීවනයෙන් කටයුතු කිරීමටත් එමඟින් හැකිවනු ඇත.

අප සැමගේ පාස්කු දින අධිෂ්ඨානය විය යුත්තේ අදට වඩා හොඳ හෙටක් නිර්මාණය කිරීම සඳහා ජේසුස් වහන්සේ විසින් ලබා දෙන ශක්තිය තුළින් ජාති ආගම් කුල ආදී කිසිදු භේදයකින් තොරව ශ්‍රී ලාංකික ජන සමාජයක් බිහිකිරීම සඳහා පදනම සකස් කිරීමයි.

ප්‍රේමයේ අනුහස් ලොවට බෙදා දීමට ඔබ සැමට ශක්තිය සහ ධෛර්යය ප්‍රාර්ථනා කරමු.



**සෝමරත්න විදානපතිරණ**
ලේකම්
බුද්ධශාසන ආගමික හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශය

## සමාජයට නවමු මෙහෙවරක් කිරීමට අදිටන් කර ගනිමු.

"චතාරිකය" එසේත් නැතිනම් "නව උපත" ජේසුස් වහන්සේ ගේ ඉගැන්වීම් අනුව යමින් අප ජීවිත නවතාවයකට පත් කරගැනීමට, දෙවිඳුන් තුල යහපත් සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට ආරාධනා කරන කාලවකවානුවකි. මේ දවස් 40 තුල ජේසුස් වහන්සේගේ දුක්විදීම, මරණය හා උත්ථානය ගැන සිහිපත් කරමින් අපගේ ආධ්‍යාත්මිකතාවය වර්ධනය කර ගැනීමට උන්වහන්සේ මඟ පෙන්වයි. මේ චතාරික සමය තුළ වඩාත් හොඳින් ජේසුස් වහන්සේ හා එක්වීමට, උන්වහන්සේගේ දිව්‍යමය වූ අභිරහස ගැන භාවනා කිරීමට ආරාධනා කරයි.

ජේසුතුමාගේ කුරුසගත මරණයට උන්වහන්සේ අර්ථයක් දුන්නා සේ අපද උතුම් වූ කල්වාරි යාගයට අරුතක් එක්කල යුතුය. දේව අභිමතය පරිදි අපේ ජීවිත මෙහෙවර තෝරා ගත යුතුය. ලෝකයක් ලෙස ජාතියක් ලෙස ඉතා අභියෝගාත්මක කාලයක් පසු කරමින් සිටින අපට ක්‍රිස්තුස් වහන්සේ පෙන්වූ මඟ අනුගමනය කරමින් සමාජයට නවමු මෙහෙවරක් කරන්නට මෙම උතුම් පාස්කුව තුල අදිටන් කර ගනිමු. සැමට සුභ පාස්කු මංගල්‍යයක් වේවා.



**එම්. චතුරි පින්තු**
අධ්‍යක්ෂ
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

## දේව ආශිර්වාදය පිරි සුබ පාස්කු මංගල්‍යයක් වේවා.

පාස්කුව යනු එතෙර වීමයි. පාස්කු මංගල්‍ය පැරණි ගිවිසුමේ හා නව ගිවිසුමේ උතුම් මංගල්‍යයක් බවට පත්වන්නේ ඒ හා බැඳුන සිදුවීම්වල ඇති වැදගත්කම මතය. ඊශ්‍රායෙල් ජනතාව තමන් අත්විඳි වහල් භාවයේ කුරිරු අත්දැකීමෙන් මිදීම දෙවියන් වහන්සේ වෙතින් ලද විශේෂ වරමක් ලෙස සලකා පාස්කු මංගල්‍ය සැමරූහ.

ක්‍රිස්තුස් වහන්සේ සිය දුක් විඳීම මරණය හා උත්ථානය තුළින් ජනතාව පාපයේ වහල් බවින් මුදා ගැනීම අද පාස්කු මංගල්‍ය තුළින් අපි සමරමු. එදා ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ ශාරීරික වහලුන් බවට පත්ව සිට ඉන් මිදීම ඔවුන්ගේ ජීවිතවල නව උදාවක් බවට පත්විය. එසේ වුවද නූතන ලෝකයේ මිනිස් වහල් සේවකයන් ගැන අසන්නට ලැබෙන්නේ ඉතා කලාතුරකිනි. එහෙත් අද ජනතාව විවිධ බලවේගවල වහලුන් බවට පත්ව ඇත. බලය බොහෝ මිනිසුන් ඒවායේ වහලුන් බවට පත්කරගෙන ඇත. ලොව පුරා ක්‍රියාත්මක මත්ද්‍රව්‍ය ජාලය අප තරුණ පරපුර මත්ද්‍රව්‍ය වල වහලුන් බවට පත්කර හමාරය. අපි බොහෝ දෙනකු ජංගම දුරකථන ඇතුළු සන්නිවේදන මෙවලම්වල වහලුන්ව සිටිමු. සමාජ මාධ්‍ය ජනමාධ්‍ය අලුත් වහල් පරපුරක් බිහිකරමින් සිටී. චතාරිකය හා පාස්කු අභිරහස අපට ආරාධනා කරන්නේ මේ මානසික වහල් භාවයෙන් මිදීමටයි. අපගේ වහල් භාවයන් නරක ඇබ්බැහිවීම් හා අප තුළ ඇති පාපී ස්වභාවය හඳුනාගෙන සැබෑ අවබෝධයෙන් යුතුව ඒවායින් ඈත් වීමටයි. එම ජීවිතයට මැරී නවජීවිතයට උපදින්නටයි. ඒ සඳහා ඔබට දේව ආශිර්වාදය පතමින් ඔබ සැමට සුබ පාස්කු මංගල්‍යයක් වේවා.

ආලේලූයියා !



# ජේසුස් වහන්සේගේ මරණයට වගකිව යුත්තෝ කවරහු ද?

ශ්‍රී සිරසේ කටු ඔටුන්න දරා
රතු ජගලාත්ත ඇඟ පොරවා
කවට රජෙක් මෙන් වද පරුෂ කරන ලද්දේ . . .
බර වූ කුරුසය කර තබමින්
උස් වූ කපාල හෙල් නගිමින්
වසක් කේඩුවෙන් වැටුනේ . . .
ශ්‍රී මේල සළු ගලවා
සර්වාංග ලේ වන පහදවා
දිව්‍ය රූප ගත නිර්වස්ත්‍ර ව වැඩ උන්නේ . . .
අදටත්,
නඩු විභාගයක් නොමැ ත.
නඩුවක් ෆයිල් කර නොමැ ත.
නඩුවක් නොමැති තීන්දුවක්
වංගු සහිත තීන්දුවක්
අත් සෝදාගත් නිවටකමක්
බෝලය පාස් කළ සාපරාධි අයුතු සහගත මරණ තීන්දුවක්
"දුෂ්ඨ ජුදයන් ජේසුස් වහන්සේව ඝාතනය කළේ මන් ද?"
විසඳුමක් නැති ගැටළුවක්
ඒත් සියල්ලෝ නිදොස් කොට නිදහස් කර ඇත.
හේතුවක් නැති මරණයකට ..... හේතුව ආදරය බව කිව්
ඒ ආදරණීය යුග පුරුෂයාගේ නොමියෙන ආදරය වටා
පිදෙන්නට, පිදෙමින් මියැදෙන්නට
ඔබට ගෙනෙන ආදරණීය ඇරයුමයි මේ....

විධායක අධීක්ෂණය
**එම්. චතුරි පින්තු**
අධ්‍යක්ෂ, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
සංස්කරණය
**ලියෝමි කැලෑපිටිය**
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
පරිගණක පිටු සැකසුම
**බී. බී.ඩී. එම්. ප්‍රියදර්ශන**
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.**

# ශ්‍රී කුරුස පුදබිමක අසිරිය

**එච්.හේමාල් පෙරේරා,**
ලේකම්, ජාතික කල්වාරි පුදබිම සංවර්ධන කමිටුව, මග්ගොන

සුරඟන තුනු සිරිනි - මත්ගොණ
රුසිරිනියුත් පණවන දැකුම - මත්ගොන
ගොස කරු නිතොරඋනු නසැ සරණ - මත්ගොන
ම මිතුර ගොස් වදන සිරි නුදුල - මත්ගොන

මග්ගොන ගම් තුලාන එදා තිසර සංදේශ හසුන්කරුවා දුටු ආකාරය ඉහත පද්‍ය පෙළින් වර්ණවත් වේ. මග්ගොන පුරාණයේ සිට දේව ආශිර්වාදයෙන් පිරී පුන්‍ය භූමියකි. එම භූමිය ලඳු කැලෑ බද කළු ගලින් බෑවුම් සහිත මනරම් භූමියකි. වර්ෂ 1548 පමණ කාලයක එම ප්‍රදේශයට මිෂනාරීන් පැමිණ දූත කටයුතුවල නිරතවූයේ යයි සාක්ෂි බොහෝය. ෆ්‍රැන්සිස්කානු නිකායික පියවරුන් මග්ගොන ග්‍රාමයේ මුල් මිෂනාරිවරුන්ය.

උතුරින් දුම්මල මෝදර සහ දකුණින් ඉදිරිල්ල ඇලට මැදිවූ ගලගොඩලන්ද බිම් කඩකි. ක්‍රි.ව.1871 ලක්දිවට පැමිණි ඉතාලි ජාතික මිෂනාරි අපෝස්තලික ගරු ඇලෝසියුස් ලුවිජි පිජිවනෙල්ලි පියතුමා ඉහත බිම් කඩ මිලදී ගන්නා ලදී. පසුව එම පියතුමා විසින් මාපිය සෙනෙහස අහිමි පිරිමි දරුවන් සඳහා එම භූමියේ ළමා නිවාසයක් ඉදිකළේය. පිජිවනෙල්ලි පියනම 1844 දී එම භූමිය හා ළමා නිවාස ගොඩනැගිල්ල නිර්මල මරියානුවෙකු වූ කොළඹ අගරදගුරු ක්‍රිස්ටෝපර් බොන්ජින්

**උතුරින් දුම්මල මෝදර සහ දකුණින් ඉදිරිල්ල ඇලට මැදිවූ ගලගොඩලන්ද බිම් කඩකි. ක්‍රි.ව.1871 ලක්දිවට පැමිණි ඉතාලි ජාතික මිෂනාරි අපෝස්තලික ගරු ඇලෝසියුස් ලුවිජි පිජිවනෙල්ලි පියතුමා ඉහත බිම් කඩ මිලදී ගන්නා ලදී.**

හිම්පාණන්ට විකිණීය. එම භූමිය වර්තමානයේ ශ්‍රී කුරුසකන්ද හෙවත් මග්ගොන කල්වාරිය ලෙස ව්‍යවහාර වේ.

### කල්වාරි පුදබිම

මග්ගොන කල්වාරි පුදබිම මන්නාරම් කඳුගැටයක පිහිටි භූමියකි. තුරුලතාවන්ගෙන් ගහන වූ, ගල්තලාවන්ගෙන් ස්වභාවධර්මයට ලෙන්ගතු වූ එම භූමිය, වර්තමානයේ දහස් සංඛ්‍යාත බැතිමතුන්ගේ පාද ස්පර්ශය ලබන පුණ්‍ය භූමියකි. දැඩි නිහඬ පරිසරයක තෝතැන්නක් වූ එම ස්ථානයේ ධ්‍යානයට සමවැදෙන්නෙකුගේ දෙසවනට කුරුලු ගීත හඬ පමණක් ඇසේ. එම භූමියේ දසුන් මනසට ගෙන දෙන්නේ විවේකයකි. ශාන්තියකි.

කුරුස කන්දේ පුරාණය ක්‍රි.ව. 1900 තරම් ඈතට දිව යයි. එහි ආකෘතිය ඊශ්‍රායල් ජෙරුසලම් නගරයේ කල්වාරි කඳු සමානය. එම කල්වාරියේම ආකෘතියක් ලෙස මග්ගොන කල්වාරියද නිමවා ඇත. කල්වාරි කඳු මුදුනේ කුරුස ප්‍රතිමා සිටුවීම ආරම්භ කර ඇත්තේ එවකට සේවය සඳහා පැමිණ සිටි නිර්මල මරියානුවකු වූ ඉනිදෝර් බෙල් පියතුමාය. එම පියතුමා කඳු ප්‍රදේශය අවශ්‍ය පමණට එළිපෙහෙළි කර ශ්‍රී කුරුස දහතුනක් (13) ස්ථාපිත කළේය. ඉන්පසු පාද නමස්කාරය එම ස්ථානවල පැවැත්විය.

### ඓතිහාසික කුරුස ප්‍රතිමාව

ක්‍රි.ව 1905 දී රෝමයේ සිට ලොව සිව්කොන දේව ජනතාවට වන්දනා කිරීමට ශ්‍රී කුරුස ප්‍රතිමා හතරක් සූදානම් කළේය. එම ජීවමාන තඹ ලෝහයෙන් තැනූ විශාල ප්‍රමාණයේ එක් ශ්‍රී කුරුස ප්‍රතිමාවක් ගරු ඉනිදෝර් බෙල් පියතුමා ලබාගෙන ලක්දිවට ගෙන එන ලදී. දුම්රිය මගින් එම ප්‍රතිමාව පයාගල දුම්රිය ස්ථානයට ගෙනවිත් ප්‍රදේශයේ බැතිමතුන් සමඟ එක්වී ශ්‍රී කුරුසිය උරහිස මත තබාගෙන කුරුස කන්දට රැගෙන විත් ඇත. එම අවස්ථාවද සනිටුහන් වී ඇත්තේ ඉතාම විචිත්‍රවත් පරිද්‍ය. බැතිමතුන් පසම් හා ලතෝනි ගායනා කරමින් ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමන් ලියන ලදැයි සැලකෙන විලාප ගීත ගායනා කරමින් එම පෙරහැර ගමන් කර ඇත. එම ශ්‍රී කුරුස ප්‍රතිමාව කඳු මුදුනේ ස්ථාපිත කර ඇත්තේ ක්‍රි.ව 1905දීය. අදටත් එම පුදබිමට පැමිණෙන සියලු බැතිමතුන් ආශ්චර්යමත් ශ්‍රී කුරුස ප්‍රතිමාව ඉදිරියේ වැඳ වැටිති; භාරහාර වෙති. තමන්ගේ දුක් කඳුළු ප්‍රතිමාවේ එල්ලී සිටින

20 පිටුවට >>>





# දෙවියන් වහන්සේගේ ආදරය, වරප්‍රසාදයේ ජීවිතයට එතෙර වීමයි

■ 2 පිටුවෙන්

අර්ථය. නමුත් මට අද දවසේ කතා කරන්නට හිතුනා පාස්කුවේ එතෙර වීම කියන භෞතික අර්ථය ගැන.

මට කතා කරන්නට හිතුනේ අද අප ජීවත්වෙන මේ ශ්‍රී ලාංකීය දේශය පිළිබඳවයි. එදා ඊශ්‍රායල් ජනතාව ඊජිප්තුවේ වහල් භාවයේ ජීවත් වුණු ජනතාවක් වශයෙන් ගෙවපු ජීවිතය හා සමාන ජීවිතයක්. කෙනෙක් කියන්නට පුලුවන් අපි වහල් භාවය තුළ නෙමෙයි ජීවත් වෙන්නෙ කියල. මේ රට නිදහස් රටක්නේ කියලා. ඇත්තටම අපි අහන්නට ඕන ප්‍රශ්නය තමයි අද අපි නිවහල් ජනතාවක්ද කියන ප්‍රශ්නය.

**1. නීතියෙන් හෝ පොලිසියෙන් අපට සිදුවුණු අසාධාරණයට සාධාරණයක් ඉෂ්ට කර ගැනීම සඳහා අපි හැමදෙනාටම සමාන අයිතිවාසිකමක් හැකියාවක් මේ රට තුළ තිබෙනවද?**

**2. කෙනෙකුගේ අධ්‍යාපන සුදුසුකම්වලට සරිලන ආකාරයේ රැකියාවක් කරන්නට අද මේ රටේ ඕනෑම කෙනෙකුට නිදහසක් තිබෙනවද?**

**3. මම මේ රටට බදු ගෙවනවා. නමුත් රාජ්‍ය ආයතනයකට ගිහිල්ල මට අවශ්‍ය කරන කාර්යය කර ගැනීම සඳහා මට සමානාත්මතාවයේ අයිතිවාසිකමක් නිදහසක් තිබෙනවද?**

**4. පාරක තොටක බැහැලා කිසිම අනතුරක් නොවී මගේ ගමනාන්තය වෙත යන්නට හැකියාවක් නිදහසක් මට අද තිබෙනවාද?**

**5. මට අසාධාරණයක් සිදුවුවහොත් ඒ සඳහා හඬක් නඟන්නට මට නිදහසක් තිබෙනවාද?**

**6. මගේම රටේ අභිවෘද්ධියට යම්කිසි තර්ජනයක් එල්ල වූ විට එය රජයෙන් වෙන්නට පුළුවන් වෙනත් පාර්ශවයකින් වෙන්නට පුළුවන්, ඒ සඳහා නීතිමය වශයෙන් හෝ මගේ හැකියාවන් තුළ හෝ එය වළක්වාලීම සඳහා හඬක් නගන්නට එය වළක්වා ගන්නට  ඕනෑම අයෙකුට ඉඩ ප්‍රස්ථාව තිබෙනවද?**

**මට කතා කරන්නට හිතුනේ අද අප ජීවත්වෙන මේ ශ්‍රී ලාංකීය දේශය පිළිබඳවයි. එදා ඊශ්‍රායල් ජනතාව ඊජිප්තුවේ වහල් භාවයේ ජීවත් වුණු ජනතාවක් වශයෙන් ගෙවපු ජීවිතය හා සමාන ජීවිතයක්.**

**7. නීතියේ සරණය ලබා ගැනීම සඳහා මට නිදහසක් අයිතිවාසිකමක් තිබෙනවාද?**

**8. දේශපාලනඥයෙකු හෝ යම් උසස් නිලධාරියකු මට විරුද්ධව යම්කිසි අසාධාරණයක් කළහොත් මට ඒ තුළින් නීතියේ සරණය ලබාගෙන ඔහුට හිමි දඬුවම ලබාදෙන්නට මට නිදහසක් අයිතිවාසිකමක් තිබෙනවාද?**

**9. මා ගෙවන මුදලට සරිලන සේවාවක් අද මේ රටේ පොදු සේවාවන් තුළින් මට ලැබෙනවද?**

**10. තවත් පැත්තකින් අපි බලද්දි අපේ රටේ බොහෝ අය මේ රටේ දේශපාලනඥයින්ගේ වහලුන් නොවෙයිද. අපේ රටේ සමහර පළාත්වල ජනතාවට තමන්ගේ නිදහස් ඡන්දය නිදහසේ පාවිච්චි කරන්නටවත් අවස්ථාවක් නැහැ?**

**11. අපේ රට විදේශ රටවල්වල අත පෙවීමක් නොමැති නිදහස් රටක්ද?**

අන්න මේ ඔස්සේ බලන විට අපට හැඟී යන කරුණ තමයි අපි මේ රට තුළ ජීවත් වුණත් අපිට ලැබිය යුතු අයිතිවාසිකම් ලැබිය යුතු නිදහස ලැබිය යුතු සමානත්මතාවය මට ලැබෙන්නේ නැහැ. එසේ නම් මම මේ රට තුළ නිවහල් කෙනෙක්ද?  ඒ ඔස්සේ බලන කල අපේ රටේ බොහෝ අය සාමාජීය වශයෙන් දේශපාලනික වශයෙන් ආර්ථිකමය වශයෙන් අපි වහලුන් වශයෙන් තමයි ජීවත් වෙන්නේ.

අන්න ඒ නිසා තමයි අද දවසේ අපිට සැබෑ එතෙරවීමක් අත්‍යවශ්‍ය වන්නේ.

අපි මේ වහල් භාවයන්ගෙන් එතෙරවන්නට නිදහස් වන්නට අවශ්‍යයි. අන්න එතකොට තමයි අපි නිදහස් නිවහල් ජනතාවක් බවට පත්වෙන්නේ. අන්න ඒ නිසාම මෙවර පාස්කුව සමරන අපි මේ වහල් භාවයන්ගෙන් අපි එතෙර වන්නේ කෙලෙසදැයි බුද්ධිමත්ව සිතා බලමු. අපව වහල් භාවයට පත් කරගෙන සිටින බලවේගයන්ට එරෙහිව නැඟී සිට ඒ බලවේග යන් පරදා ඒවාලින් නිදහස් වන්නට අප උත්සාහ ගනිමු.

ඒ සඳහා පළමුවෙන්ම අපි කිසිවෙකුටවත් ගැති නොවී නිවහල්ව නිදහස්ව සිතන්නට පතන්නට මම අභිමානවත් කෙනෙක් බව තේරුම් ගන්නට උත්සාහ කරමු. ඊළඟට අපි හැමදෙනාමෙ එක්ව එක්සත්ව නැගී සිටින්නට අදිටන් කර ගනිමු. අන්න ඒ එකමුතුකම තුළ අපිට පුළුවන් මේ රට නිදහස් රටක් කරගන්නට, මේ රටේ සිටින සියලුම ජනතාව නිවහල් ජනතාවක් බවට පත් කරන්නට.



# ජුදයාවේ මරියා සහ තවත් අම්මලා

අජිත් මෙන්ඩිස්

**ඉපදී පොඩි ගව මඩුවේ**
**හැදී වැඩී වඩු මඩුවේ**
**මාලිග මන්දිර මණ්ඩප පුපුරා**
**නැඟූ කේසර හඬ අයෝම මැයි පුතුනේ**
**අභීත මැයි පුතුනේ.**

ඉතිං පුතේ නුඹ බිහි වූ දිනේ සිට
ඇතින්නියක හදකින් ලද පෙමට
ගිහින් එම් කියාවත් නොකියා යන විට
ඇහෙන් ගලා හැලුණා හදවත බිමට

මේ කවිය හම්බ වෙන්නෙ කයදුෂ්කාර ප්‍රාර්ථනාවෙත්, දේශනා නවයේ පසන් පොතේවත් නෙමෙයි. අපේ කාලයේ කවියා මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ 'හිරුත් හිම පියල්ලක' ඔහුගේ පළවෙනි කවි පොතේ. ඔහු එක තැනක ලියනවා කවියක් වර්තමාන මව් දරු සම්බන්ධතාවය ගැන. නිමිත්ත සිය මව අතරමං කර දමා පැන යන පුතෙකු ගැන. අද සමාජයේ මනුස්සකම් දුරස්වෙන ආකාරයට මව් දරු සම්බන්ධතා වුනත් දුරස්වෙන එක පුදුමයක් නෙමෙයි. අම්ම පුංචි කාලෙ පුතාව ඔක්කෙ ගහගෙන බදා වැළඳගෙන හදාවඩා ගන්නවා. ඒත් ලොකු වුනාම පුතා අම්මව අතඇරල පලා යනවා. ඒ යන්නෙ පුරුෂාර්ථ බිඳුන සමාජ මොඩලයේ හිත් පිත් ගල් වෙච්චි නිසා.

ඉපදී පොඩි ගව මඩුවේ
හැදී වැඩී වඩු මඩුවේ
මාලිග මන්දිර මණ්ඩප පුපුරා
නැඟූ කේසර හඬ අයෝම මැයි පුතුනේ
අභීත මැයි පුතුනේ.

එහෙම ගැයුවේ නන්දා මාලිනී. ගී පද මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගෙන්. මහින්ද ලියූ කවියෙත්, සුනිල් ආරියරත්නයන් ලියූ ගීයෙත් තිබුනෙ වින්දිත මවකගේ හෘද බින්දිත එකම ශෝක චක්‍රයමැයි. මවකගේ ආත්ම කථනයමැයි. නන්දා මාලිනිය මරිය මාතාවන්ට සමාරෝපනය වන විට, ගැමි කවියේ මහින්ද දකින මාතාව වත්මන් පොදු මව්වරුන්ගේ යම් සම්‍යතාවයකට ඒකාත්මික වෙනවා. දෙදෙනාටම දරුවන් අහිමි වෙනවා.

අපි තාරුණ්‍යයෙන් ඔබ්බට පය තියන අන්ධකාර යුගයේ රෑට රෑට වෙඩි හඬ ඇහුනා, හද්‍ර යෞවනයේ පණසුන් පිරිපුන් සිරුරු මගතොට දැවුණා. කැපුණු බෙලි, සතුන් කා දැමූ, මෙන්ම ගඟ දිය රැගෙන යන සිරුරු තිගැස්සුන දෑසින් දුටුවා. ඒ හැම පුතෙක්ටම අම්මෙක් හිටියා. තවත් කාලයක වන්නි, උතුරු - නැගෙනහිර මෙන්ම දකුණු ලකෙහිත් තම ලේ කිරෙකන් පෝෂණය කළ පුතුන් බෝම්බයෙන්, වෙඩි උංඩයෙන් මියැදි සිටිනු දකින මව්වරුන් කොතරම් කම්පිතව හදවතින් දැවෙන්නට ඇතිද ?

ඒ වගේම වඩු මඩුව සහිත නාසරතයේ නිවස මිදුලේ හිඳ නිතිපතා දිගාන්තයේ උදුලව නැගී කල්වාරි කඳු මස්ථකය ඒ අඳුරු සිකුරාදා සිය පුතුගේ පණ නල වා තලයට මුසුකරනු ඇතැයි මරි මව් කිසිදා සිතන්නට නැත. ඇය සැබැවින්ම මෙසේ ගයන්නට නැත. එහෙත් හදවතින් වුව ගැයෙන්නට ඇතැයි අපි සිත් දරමු. සිය පුතුගේ මරණය සකල ජනතාවගේ විමුක්තියේ ද්වාරය විවර වන විරාමය බව ඇයට ඉඟි ලැබී තිබෙන්නට ඇත. මොන දේ වුනත් අම්මා කෙනෙක් මොන හිතකින් තමාගේ දෑස් ඉදිරියේ සිය පුතු ඝාතනය වන හැටි දැක සැනසෙන්නටද?

මා දුක් වන්නේ නෑ පුතේ නුඹ ගැන
සෙබලුනි මන්ද විරාමය හෙල්ලෙට
අනිච් මා පුතුගේ ඇලයට
සෙලවෙන්නේ පුතු සිරුරේ ලේ පමණයි
සැඟවෙන්නේ මා පුතු පණ නළ පමණයි.

එදා සිදුහත් කුමරුන්ට කිසාගෝතමිය කී නිබ්බුත පද කුරුස ගසේ දිවි දුන් සිය පුතු වෙනුවෙන් ඈ ගයන්නීය.

මෙසියස් තුමාගේ උපත පිළිබඳ එදා ජුදා සමාජය පැවතියේ කල්පිත කථා, මුඛ පරම්පරාගත කථා මෙන්ම දිවැසිවරුන්ගේ අනාගත වක්තෘවරුන්ගේ කතා ඉතා ජනප්‍රිය වූ යුගයකය. සෑම ජුදා තරුණියකම වාගේ ඒ ගැබ දැරීමේ මහරු වටිනාකම වෙනුවෙන් මහෝත්තම දෙවියන් වහන්සේට යාච්ඤා කළෝය. අනාගත වක්තෘන්ගේ බසට අනුව ඊට හිමිකම ලබන්නේ දාවිත්ගේ පරම්පරාවේ ළඳක බව දැනගත් දාවිත්ගේ පරපුරේ තරුණියන් තම අයිතිය වෙනුවෙන් සැදී පැහැදී සිටියහ. ඒ වෙනුවෙන් දෙවියන්ට පසස ගී ගැයුහ.

ජුදයාවේම බෙත්ලෙහෙමෙයි උපදින ආනා, විවාපත්වූයේ ජුදයාවේ නාසරතයේ ජුවකීනු සමඟයි. ඔවුන්ගේ දියණිය මරියා ද දාවිත්ගේ වංශයේ නිසා ශුද්ධ ලියවිල්ලේ සඳහන් කරුණු දැන සිටියාය. මේ කාලයේ ජුදයාව රෝමයේ යටත් විජිතයක් නිසා සිය සහෝදර ජනයා මුහුණ දෙන ගැටළු ඇය දැන සිටියාය. ඒ ගැන කම්පා වූවාය. මේ ඊශ්‍රායෙල් ජනයා රෝම වහල් බැම්මෙන් මුදා ගැනීමට මෙසියස් තුමාගේ පැමිණීම උදෙසා යාච්ඤා කළාය.

එහෙත් මෙසියස් තුමාන්ගේ මව් තමා වේ යැයි ඇය සිහිනෙකුදු නොසිතන්නට ඇත. බලාපොරොත්තු නොවූ වෙලාවක පැමිණි ග්‍රාබ්‍රියෙල් දේව දූතයාගේ වදන් අසා ඇය බයබ්‍රාන්ත වන්නට ඇත. අවිවාහක තමා කෙසේ ගැබක් දරන්නේදැයි විපිළිසර වන්නට ඇත. තමාට විවාබස් දී සිටින ජෝශප් මෙය කෙසේ තේරුම් ගනු ඇතිද, ඔහු තමා අතැර ගියහොත් සමාජ අපවාදයන්ට කෙසේ මුහුණ දෙන්නේදැයි බියපත් වන්නට ඇත.

'ශුද්ධාත්මයාණන් ඔබ කෙරෙහි පහල වන සේක. පරමෝත්තමයාණන් ඔබ කෙරෙහි පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභාවයද ඔබ වසා ගන්නේය.'' (ලූක් 1.35-37) දේවදූතයාගේ පිළිතුර එසේ විය. දාවිත්ගේ පරපුරේ දුවණියක ලෙස දෙවියන්ගේ කැමැත්තට පිටුපෑමට ඇයට නොහැකිය. වෙන දෙයක් වෙච්චාවේ කියා ඇය සිත හදාගත්තා විය හැකිය. ඇන්ටියෝකයේ උපන් ශු. ලූක්තුමා පැවසූ බසත් සමඟ ඇරඹි කතා මාලාව කෙළවර වූයේ ට්‍රැජිඩියකිනි. එදා පටන් අම්මා වරුන් අනුදක්නා පුතුන් අරඹයා වූ කම්පිත ශෝක චක්‍රය ස්වරූපය පමණක් වෙනස් වෙමින් අද දක්වාම සෙක්කු ගමනක යෙදී සිටියි.

අපේ කාලයේ අපි ඇසූ දුටු අම්මලාගේ කම්පිත කඳුළු සාගර ජලයට වඩා වැඩිය. මේ කම්පිත සිදුවීම අපට සිහි කැඳවන මහ සිකුරාදාව ඇත්තෙන්ම අපට බර දිනයක්මය. එහෙත් අප බාලයේ දුටු මහ සිකුරාදා දින කළු රෙද්ද සහ කළු හැට්ටය හැඳ දූව, බොරැලැස්ස, ජා-ඇල, තලවිල, පිටිපන පාස්කු දකින්නට යන ගැහැණුන් ගියේ පල්ලි නොවේ මළ ගෙවලටය. ඒ තරමට ඔවුන්ගේ ස්වරූපය ශෝකීය. අදටත් හදවතේ කිඳා බැස සිටින ඒ වියපත් ගැහැණුන් තවම අපේ ඇසේ ඇලවී සිටිනවා මෙන් දැනෙන්නේ සැබෑ මහ සිකුරාදාවන් එදා මෙන් අද දකින්නට වත්මනේ ඇත්තෝ පිං පුරා නැති බැවිනි.



# කුරුසිය පාමුල දේව අම්මා

**ගරු. කේ. සුමිත් සමීර ප්‍රනාන්දු සහෝදරතුමා.**
සාන්ත ජුසේවාස් දේව ධර්ම නිකේතනය, කොළඹ 08

"එකල ජේසුස් වහන්සේ සිය මෑණියන් ද තමා ප්‍රේම කළ ශ්‍රාවකයා ද ළඟ සිටිනු දැක, ස්ත්‍රීත්වය, මෙන්න ඔබේ පුත්‍රයාය" යි සිය මෑණියන් හට වදාළ සේක. ඉන්පසු උන් වහන්සේ එම ශ්‍රාවකයාට කතා කොට, "මෙන්න ඔබේ මෑණියෝ" ය යි වදාළ සේක. ඒ මොහොතේ සිට ඒ ශ්‍රාවකයා තම නිවසට ඇය පිළිගත්තේය." (ශු. ජොහාන් 19 : 26-27)

එදා බෙත්ලෙහෙමේ දී දේව මාතාවන් වහන්සේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ හට පුත්‍ර භාවය දානය කරමින් නව ආදම්" ලොවට බිහි කළාය. හේබ්‍රෙව් බසින් "ගොල්ගොතා" යයි කියන කපාල පිටිය නම් කඳු මුදුනේ දී ක්‍රිස්තුස් වහන්සේ දේව මාතාවන් වහන්සේට "ස්ත්‍රිය" කියා අමතමින් නව ඒව (ජීවමාන සියල්ලන්ගේ මාතාව) ලොවට ජනිත කළාය. එනයින් දෙව් මවුන්ගේ දෙවන මංගලම් කීම ගොල් ගොතා කඳු මුදුනේ කුරුසියේ පාමුල සිදුවිය. එකී ගාබ්‍රියෙල් දේව දූතයා මංගලම් කීම අරඹයා දේව මාතාවන් වහන්සේ අප සියල්ලන්ගේ ආදරණීය අම්මා" බවට පත්විය. එතැන් සිට එතුමිය නව අධ්‍යාත්මික පරම්පරාවක් නිර්මාණය කිරීමේ පුරෝගාමී චරිතය බවට පත්වන්නීය. බෙත්ලෙහෙමේ සිට ගොල් ගොතාව දක්වා එතුමිය දෙවිඳුන් හා සෘජු සබඳතාවයක් ගොඩ නැගූ අතර ඉන්පසු එතුමිය ඇයගේ දරුවන් වන අප සමඟ ගැඹුරු සබඳතාවයක්ද ගොඩනගමින් සමිඳාණන් වහන්සේ හා අප අතර මධ්‍යස්ථකාරිය බවට පත්විය.

මරියෝත්තමාවන් යනු සරලභාවයෙන් පිරුණු තැනැත්තියකි. එතුමිය තුළ විශ්වාසය, නිහතමානිකම, බැහැපත්කම, ඉවසීම හා එඩිතරකම වැනි කිතුනු ගුණාංග රාශියක් දක්නට ලැබුණි. මරියෝත්තමාවන් වනාහි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආදරණීය මෑණියන් මෙන්ම ප්‍රථම ශ්‍රාවිකාවිය විය. එතුමියගේ දරු කැල වන අපි එතුමිය මෙන්" මම ඔබ වහන්සේගේ දාසිය වෙමි. ඔබ කී වචනය ලෙස මට සිදු වේවායි..." පැවසීමට අදිටන් කර ගනිමු.

# මේ වරප්‍රසාදීය කාලයයි

කතෝලිකයින් වන අප අතර ආත්මික වශයෙන් මනස්තාපවීමේ උතුම්ම කාලය මේ පාස්කු කාලයයි. ජේසුතුමා දින හතළිහක් පුරාවටම මහත් පාළු කතරක ශාරීරිකව හා මානසිකව බොහෝ දේ විඳ දරා ගත්තා. ඒවා අපටත් උරුම විය යුතුයි. ගැලවීම ලබන්නට ලේසි නැහැ. ජේසුතුමා ගිය පාරේ ගමන් කිරීමයි අප කළ යුත්තේ.

ඇත්තෙන්ම මේ කාලය දේව වරප්‍රසාද ගලාඑන කාලයයි. එසේ ශුද්ධවූ සභා පණතින් කියවෙනවා අවුරුද්දකට වරක් හෝ පාපොච්චාරණය කළ යුතුයි. ඒ අනුව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ද ලබාගත යුතු වෙනවා කතෝලිකයෝ මේ පනත අකුරටම පිළිපදිනවා. එක්වරු ශීල රැකීමත්, ගොඩමස් වැලකීමත් විශේෂයෙන් මේ කාලය තුළ සිදුවිය යුතුයි. විශේෂයෙන් දානමාන දීමත් ඇතුළුව මේ සියලුදේට දේවාශීර්වාද ලැබෙන ක්‍රියාවල්.

වසර පුරාම දේවස්ථානයක පළාතට නොගිය එහෙත් මහා සිකුරාදාට පමණක් දේවස්ථානයට ඇතුල්වෙන පිරිසකුත් ඉන්නවා. මේ අතර සමූහ පාද නමස්කාර බැතිය ද නොඅඩුව කෙරෙනවා. මේවා කිරීමෙන් වරප්‍රසාද ලැබෙන්නේ අපටම ය. එබැවින් මේ වරප්‍රසාදිය කාලය තුළ පසුතැවීමෙන් හික්මීමට ඉටා ගනිමු.

**ජේ.විල්ප්‍රඩ් සමරසිංහ**
හාල්දඬුවන.



# දේව ආදරය අත්දකිමු

ජීවිතේ සමහර වේදනාවල් කෑ ගහල අඬන්න ඕන තැන්වලත් මහ හයියෙන් හිනා උන,දැන් මේක කරන්න බෑ ඇති කියලා හිතුණ තැන්වලත් අමාරුවෙන් දරාගත්ත, ප්‍රතික්ෂේප වීම දරුණුවට ම දැනුණ තැන්වලදිත් අමාරුවෙන් අල්ලගත්ත,වේදනාව ආදරය හිනාව පසුබෑසීම මේ සැමදෙයක්ම අමාරු කාර්තුවකදී දරාගෙන ලස්සන වසන්තයකදී ලොකු කථාවක් අපට මතක් කරනවා.

ඒ තමයි ජේසුගේ ආදරය..

ඉතින්, පාපයේ වහල්කමින් වෙලාගෙන සිටින සමාජය ජේසුගේ ආදරය අත්වින්දේ හරි අඩුවෙන් ඒ සෑම තැනම මිනිසුන්ගේ සිත්තුල වෛරය, ආත්මාර්ථකාමීකම, තණ්හාව පිරිලා තිබුණා.ඒ නිසා ජේසුගේ ආදරය පෙනුනේ නැහැ.

ඒ නිසාම ජේසු ළඟින් ම ඇසුරු කළ,වේදනාව,ආදරය බෙදා ගත්තු අයම ජේසුව පාවා දීමට උත්සහ කළහ. අපහාසය, අවමානය, පිළිගැනීම, වෛරය, ඊර්ෂ්‍යාව මත ජීවත් වෙමින් දේව ප්‍රේමයට පටහැනිව පව් කරන්නෝ එදා මෙන්ම අදත් කුරුසියක් කරට ගත් ජීවිත ගමනේ දුෂ්කරතාවය අවබෝධ කරනොගෙන දිවි ගෙවති.

නමුත් ජේසු ඔවුන්ට වෛර කරන්නටත් ශාප කරන්නටත් වෙනුවට ඔවුන් උදෙසා යාච්ඤා කරමින් තවත් ඔවුන්ට ප්‍රේමය දැක්වූයේ අපගේ ජීවිතයට ලොකු පාඩමක් කියා දෙමින්ය.

බර වූ කුරුසියක් කරගහගෙන කල්වාරියේ දුක් විඳිමින් කුරුස ගසක එල්ලී ජීවිතය පූජා කළේ ඒ අසීමිත ආදරය ඔප්පුකරමින්ය. වේදනාව නොපෙන්වා සිනහවකින් ඔවුන්ට සමාව දෙන්නට තරම් සංවේදී වූ සැටි හරි අපූරුය.

පියෙක් තම දරුවන්ට දක්වන අසීමිත ආදරයමෙන් ජේසුගේ ආදරය මුළු ලොව පුරා පැතිර ගියේය. ආදරයේ වටිනාකම තුළ කැපකිරීම උතුම් බව තම ජීවිත පූජාවෙන් ඔප්පු කලේය. අළු බදාදායින් ඇරඹි මේ පාස්කු සමය අප වෙනුවෙන් දුක් විඳිමින් මරණය දක්වා අපගේ හෙට දවස එළිය කරන්නට ජීවිතය කැපකල ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම මරණය හා උත්ථානය සිහිපත් කරමින් උන්වහන්සේ විඳි දුක් වේදනා උදෙසා දෙවියන් වහන්සේට යාච්ඤා කරමින් දේව දරුවන් ලෙස සැබෑ සිත් හැරීමක් තුළ දේව ආදරය අත්දකින්නට දෙවිඳුන්ට ළංවෙමු !

**ඒ.එම්.ෂයිනි විශ්වදිනි ප්‍රනාන්දු**
සා.හෙලේනා දේවස්ථානය, හිරිපොකුණ

# ජුදා පාස්කු මංගල පිළිවෙත

**බී.කේ. මාලින් ද එරෝෂණ රොද්‍රිගු**
දළුගම මීසම

**අතීතයේ එඬේරුන් හා ගොවීන් අතර පැවැති මෙම පිළිවෙත් මෝසෙස්ගේ නායකත්වය යටතේ පාස්කු මංගල්‍යයට සම්බන්ධ විය. පාස්කු බැටළුවා සම්බන්ධ පිළිවෙතට එමගින් නව අර්ථයක් හිමිවූ අතර ඌ දෙවියන් වහන්සේ සමග ඇතිකරගත් ගිවිසුම සංකේතවත් කරනු ලැබීය.**

"පාස්කුව" යන සිංහල වචනය **Pass Over** නැමති ඉංග්‍රීසි වචනයෙන් බිඳී ආවකි. ඉන් අදහස් කෙරුනේ එතෙර වීමයි. ඊශ්‍රායෙල් ජනතාව සමරනු ලැබූ මංගල්‍යයන් අතරින් ප්‍රධාන මංගල්‍යය ලෙස පාස්කු මංගලෝත්සවය දැක්විය හැකිය. ඔවුන් පාස්කු මංගල්‍යය ලෙස සමරනු ලැබුවේ මිසරයේ කුළුඳුලන් මරා මිසරයේ වහල් බවින් මිදී මෝසෙස්ගේ නායකත්වය යටතේ පොරොන්දු දේශයට පැමිණීමේ ඓතිහාසික සිදුවීමයි. එය පුරාණ ගිවිසුමේ පාස්කුව විය. ජේසුස් වහන්සේ කුරුසිය මත සිය දිවි පුදා පාපයේ වහල් බැම්මෙන් අප මුදා අජරාමරව උත්ථාන වෙමින් පාස්කු මංගල්‍යයට නව අර්ථයක් ලබා දුන්නේය.

ඊශ්‍රයෙල් ජනතාව දේව නියමය පරිදි එම ඓතිහාසික සිදුවීම ජයෝත්සවයෙන් සමරනු ලැබීය. ජුදා පාස්කු මංගල්‍යයට ඊටම ආවේණික වූ පිළිවෙත් කිහිපයක් පවතී. (නික්මයාම 12:1-15) ජුදා දින දර්ශනය අනුව වසරේ පළමු මාසය වූ නිසාන් මාසයේදී පාස්කු මංගල්‍යය සමරනු ලැබීය. ජුදා පාස්කු මංගල්‍යය තුළ ප්‍රධාන පිළිවෙත් දෙකක් දැකගත හැකිය.

1. පාස්කු බැටළුවා සම්බන්ධ පිළිවෙත.
2. නුමුහුන් පූප සම්බන්ධ පිළිවෙත .

මෙම පිළිවෙත් පාස්කු මංගල්‍යය පිළිවෙතේ අන්තර්ගත වුවද මෙම පිළිවෙත් වෙන් වෙන් වශයෙන් අතීතයේ සිටම පැවති පිළිවෙත. පාස්කු බැටළුවා සම්බන්ධ පිළිවෙත අතීත එඬේරුන් අතර පැවතී පිළිවෙතකි. එඬේරුන් සංචාරක ජීවිතයකට හුරු පුරුදු පිරිසක් වූහ. සිය බැටළු රැල සමඟ නව තණබිම් සොයා යාම ඔවුන්ගේ ජීවිකාව විය. මෙලෙස ගමන් ගන්නා එඬේරුන්ට සීත කාලය උදාවීම දුෂ්කර කාලයක ආරම්භයයි. සීත සෘතුවේදී තෘණ බිම් විනාශවීම නිසා එඬේරුන්ට මෙන්ම ඔවුන්ගේ බැටළුවන්ටද ආහාර සොයා ගැනීම සම්බන්ධයෙන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවේ. සීත සෘතුවෙන් පසු උදාවන්නේ වසන්ත සෘතුවයි. මෙම කාලයේදී ගහකොළ නැවත දළු දමා වැඩීම සිදුවේ. එඬේරුන්ද සුපුරුදු පරිදි තණ බිම් සොයා ගමන් කරයි. ඊට පෙරාතුව බැටළුවකු රැගෙන බිළි පූජා කිරීම සිදුකරයි. ආරම්භ කරන ගමන තුළ ආරක්ෂාව පතා මෙය සිදුකරයි. මරණ ලැබූ බැටළුවාගේ ලේ කුඩාරම්වල කණුවක තවරනු ලබයි. ඒ තුළින් ඔවුන් දේවාරක්ෂාව ලැබෙන බව විශ්වාස කළේය. එඬේරුන් මෙම පිළිවෙත සිදුකරනු ලැබුවේ නිසාන් මස 14 වන දිනයේය. එය වසරේ මුල්ම පසළොස්වක පොහෝ දිනය විය.

නුමුහුන් පූප සම්බන්ධ පිළිවෙත පුරාණ ගොවීන් අතර පැවති චාරිත්‍රයකි. ගොවීහු තමන් ලැබූ සාරවත් අස්වැන්න වෙනුවෙන් දෙවියන්ට තුති පිදීමට අස්වැන්නෙන් පූප සෑදූහ. අලුත් අස්වැන්න නෙළා ගත් පසු නිවසේ පැරණි අස්වැන්න ඉවත් කිරීම සිරිතකි. මේ සිදු කිරීමේදී පූප පිපීම සඳහා භාවිතා කරන පැරණි මුහුන්ද ඉවත්කරයි. නව අස්වැන්නෙන් ආහාර සඳහා පූප සාදා ගන්නා ගොවීන් ටික කාලයක් නුමුහුන් පූප අනුභව කරයි. ඊට හේතුව වූයේ අලුත් මුහුන් සෑදීමට යම් කාලයක් ගතවන නිසාය.

අතීතයේ එඬේරුන් හා ගොවීන් අතර පැවැති මෙම පිළිවෙත් මෝසෙස්ගේ නායකත්වය යටතේ පාස්කු මංගල්‍යයට සම්බන්ධ විය. පාස්කු බැටළුවා සම්බන්ධ පිළිවෙතට එමගින් නව අර්ථයක් හිමිවූ අතර ඌ දෙවියන් වහන්සේ සමඟ ඇතිකරගත් ගිවිසුම සංකේතවත් කරනු ලැබීය. බැටළුවා සම්බන්ධ පිළිවෙතටම කුළුඳුලන් සම්බන්ධ පිළිවෙත් ද එකතු විය. මන්දයත් කුළුඳුලා දෙවියන් වහන්සේට කැප වූ කෙනෙකු වූ බව ඔවුන් විශ්වාස කළ නිසාය. පාස්කු මංගල්‍යයක දී පූපවලට මුහුන් නොයොදා නුමුහුන් පූප අනුභව කරනු ලැබුවේ වෙනත් අර්ථයකිනි. ඊශ්‍රායල් ජනතාව මිසරයෙන් නික්මෙන රාත්‍රියේ ඉක්මනින් පිටව යා යුතු නිසා ඔවුන්ට මුහුන් මිශ්‍ර කිරීමට තරම් කාලයක් නොතිබුණි. එලෙසම පූප වලට මුහුන් මිශ්‍රව තිබුණද ඒවා නිසි අයුරින් පිපීමට කාලයක් නොවීය. ඔවුන් කඩිමුඩියේ පිටවූ බැවින් නික්මයාම ගමනේ පළමු දින නුමුහුන් පූප අනුභව කරන ලදී. පසුකාලීනව එයට දේවධාර්මික අර්ථයක් හිමි වූ අතර නුමුහුන් පූප මගින් දේව නියමය කඩිනමින් ඉටු කිරීම සංකේතවත් කරයි. ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ විඳි දුක් වේදනා සිහිකිරීමට තිත්ත පලා හා නික්මයාමේ ජයග්‍රාහී මංගල්‍ය සිහිවීමට මිදියුෂ භාවිතා කරනු ලැබීය. ජුදා ජනතාව වසරක් පාසා මෙම සිදුවීම ස්මරණය කළ අතර එය බාල පරම්පරාවන් වෙත දායාද කරනු ලැබීය.













# පසමට පෙම් බැන්දෝ ප්‍රාතිහාර්යය අත්දැක්කෝ

**ආචාර්ය ගරු ලාල් පුෂ්පදේව ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා**
අනුශාසක, පසම් සංරක්ෂණ කමිටුව හා නිර්මාණ අධ්‍යක්ෂ



සියවසකට අධික කාලයක් පුරාවට කිතුනු දහම ශ්‍රී ලංකාවෙන් අතු ගා දමමින් ලන්දේසි ආගම පතුරුවන්න උත්සාහ ගත් කාල වකවානුවේ තම දිවි පරදුවට තබා අප දිවයිනට සැපත් වූ ජුසේවාස් පියතුමන් දෙවි පියාණන් වහන්සේගෙන් ම ලද ආශ්චර්යමත් දහම් තිලිණයක් වූ බව නොරහසකි.

ශ්‍රී ලාංකේය කිතුනු දහම් කෙත අස්වැද්දීමේ අසීරු කර්තව්‍ය බාර ගත් ජුසේවාස් පියතුමන් එකී මෙහෙවර විඳිමින් එය ඉෂ්ඨ කිරීම සඳහා තම ඥාති පුත්‍රයෙකු වූ ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමන් හට පුද්ගලිකව මෙම සේවාවට ආරාධනා කලේ එතුමන් තුල තිබූ සහජ හැකියාවත් භාෂා ඥානයත් භාවිතා කරමින් දේව වචනය අනාගතයට ඉලක්ක කර ගනිමිනි.

භාෂා ප්‍රාඥයෙක් මෙන් ම ගැඹුරු සාහිත්‍ය ඥානයකින් හෙබි එතුමන් ට ඒ සියල්ලටම නොදෙවෙනි තවත් සුවිශේෂී හැකියාවන් ද තිබුනි. එ භාෂාවෙන් සාහිත්‍ය රසවින්දනයට ගෝචර වන සේ නිර්මාණශීලීව හසුරවමින් කරන ලද ගද්‍ය පද්‍ය සහ ඒවාට නව සංගීතමය විශ්ව භාෂාව යොදවමින් අලංකාරණය කිරීම ය. ගද්‍ය පද්‍ය නිර්මාණ කරමින් මිනිස් හැඟිම් වල සියුම් ප්‍රභේදයන් සියුමැලිව ස්පර්ශ කරමින් ජේසුස් වහන්සේගේ දුක්ඛප්‍රාප්තිය, කුරුසය තුළ මරණය සහ උත්ථානය යන ත්‍රිත්ව දේව ධර්මතා සෝකය නැමති රසකාරකය එකතු කරමින් ජන භාවිතයට ගෙනෙන්නට එතුමන් ගත් උත්සාහය අතිශය ප්‍රශංසනීයය.

එවන් විශ්ව කර්ම නිර්මාණයන් මියයාමට ඉඩදිය හැකි ද? නැති වී යාමට ඉඩ හැරිය හැකි ද? එවන් දේශජ ජාතික උරුමයන් මහ පොළවට පස් වීමට ඉඩ නොදී එය එල දරන්නට සැලැස්වීම ජාතික අවශ්‍යතාවයක් සේ හඳුනාගත් ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, එහි ඇති අන්තරාව ඉතා සියුම් ලෙස හඳුනාගෙන එම උත්කෘෂ්ඨ නිර්මාණශීලී ශෝකාකූල ජන ගායනා ශෛලියන් තවත් සහස්‍රයකට නොව ලොව පවතින තුරු නොමැරී පවතින ක්‍රමවේදයක් සොයා යන්නට පළමුව කරනුයේ එම විෂය බද්ධ ක්ෂේත්‍රයේ ප්‍රාඥයින් සොයා මුණ ගැසීම ය. සිරිලකේ සතර දෙසින් එවන් ප්‍රාඥයින් සොයා ඔවුන්ගේ වටිනා අදහස් යෝජනා එකතු කරමින් අනතුරුව කරනුයේ පසම් සංරක්ෂණ කමිටුවක් පිහිටුවාලීම ය.

සිව් වසරක ආසන්න කාලයක් ආ ගමනේ ආරම්භය ගන්නේ සලාපුරෙනි. එයට විශේෂ හේතුවක් තිබුනි. එය මා සටහන් නොකලොත් මා විසින් ම සිදු කර





ගන්නා සිය දිවි හානි කර ගැනීමක් වැනි ය. මා එසේ පවසනුයේ පසම් ලතෝනි පළමුව පෙම් බැන්ද පෙම්වතෙක් අප සමග හිටපු නිසා ය. එහෙත් අද ඔහු අප හැර ගොස් ය. ඔහු නමින් ගරු ෆ්‍රෑන්ක් තිසේරා පූජාප්‍රසාදීන් වහන්සේ ය. එතුමන්ගෙන් පුද්ගලික ව මා ඉගෙනගත් දේ බොහෝ ය. පසමට පෙම් බැඳි දෙවැන්නා වීම ගැන මා හදේ කොනේ ඇත්තේ සියුම් අභිමානයකි. ආඩම්බරයකි. එය මෙම සටහනේ ඉතා අව්‍යාජ පුංචි සෙල්ෆියකි. සලාපුර පීරා පසම් ලතෝනි සොයන්න අපට අවශ්‍ය නොවී ය. එය හිතුවාට වඩා අපූරුවට නිම කර තිබීම මගේ බරින් හරි අඩක් ඔළු ගෙඩියෙන් අරන් බිම තිබ්බා සේ ය. සලාපුරයේ පසම් ලතෝනි කාර්ය මුල සිට අගටමත් අග සිට මුලටත් ඇත්තේ අමතක නොවන මතක සාගරයකි. එය වෙනම ආචාර්ය උපාධියක පර්යේෂණ ග්‍රන්ථයක කරුණු ප්‍රමාණය ඉක්මවා යන තරම් විශාල ය. රූ ගත කිරීම් පුද්ගලික ව මාගේ ජීවිතයේ ප්‍රාතිහාර්යයන් අත්දැක්ක දවස් ත්‍රිත්වයයි. එය ද වචනයෙන් දෙකෙන් ලියා නිම කළ නොහැකි ය. එය තවත් ප්‍රාතිහාර්යයකියි කියා මා අවසන් කරමි.

එතැනින් නොනැවතී පාස්කු සංදර්ශනයෙන් ලෝකයට අප රට ගෙන ගිය පුංචි රෝමය ලෙස විරුදාවලිය ලත් මීපුරයෙනි. එය අපගේ දෙවැනි අඬහැරය ඇරඹුන වේදිකාවයි. මී පුරය, කලාගාරයක් බඳු, කලා කරුවන්ට උපත දුන් උපත දෙන සශ්‍රීක තෝතැන්නකි.

සලාපුරයේ මෙන් ම මීපුරයේ කළ වික්‍රමයන් සටහන් කිරීම මා නොකල යුතු ය. මන්දයත් එය අභිරහසක් පැහැදිලි කරන්නට යන නිශ්ඵල වෑයමක් බඳු වන නිසා ය. එය එතරම් ම විශ්ම කර්ම ක්‍රියා රාශියක එකතුවකි. එය ද සලාපුරයට නොදෙවෙනි සේ ප්‍රාතිහාර්යාත්මක ය.

මී පුරයෙන් නොනැවතී අපි ගියේ දක්ෂිණට ය. එය වචනයේ පරිසමාර්ථ අර්ථයෙන් ම කිවහොත් පසම් සොයා ගිය ගවේශනාත්මක ම චාරිකාවයි. පසම් සංරක්ෂණ කමිටුවේ ප්‍රබලයන් වූ ලෙනාඩ් කුරේ සහ අමිතගෙන් එහි මූලාශ්‍රයේ ආරම්භය ලබා ගත් අපි වාද්දුවෙන් පටන් ගෙන කළුතර නොනැවතී ගාල්ල දක්වා ගමන් ගතිමු.

මී පුරයේ හා සලාපුරයේවත් නැති පසම් දක්ෂිණෙන් මතුවිය. සියල්ල එකතු කර ගත් විට 513ක් විය. එය තෝරා බේරාගෙන දක්ෂිණයට ම ආවේනික පසම් ලතෝනි 114ක් විය. එයින් ඔවුනට ගායනා කිරීමට හුරුව තිබුනේ පළමුව 48ක් වැනි සුළු ප්‍රමාණයක් වුව ද එය 60 දක්වා වැඩි කර ගැනීමට හැකි විය. සලාපුර හා මීපුරට අයිති නොවූ දක්ෂිණට පමණක් අයිති

22 පිටුවට >>>

# එතෙර වීමක් නොලද ලාංකීය ආර්ථිකය



වෛද්‍ය සචිත මෙන්ඩිස්

පාස්කුව ගැන අනාදිමත් කාලයක සිට පළවූ ලිපි එකතුකල විට එහි සාරාංශය මට හැගෙන ආකාරයට එක වචනයකි. ඒ එතෙර වීමයි. මෙතෙරට වඩා එතෙර හොඳය. සැප පහසුය. මෙතෙර කටුකය, ගැහැට බහුලය. මීට අවුරුදු පනහකට එපිට ලංකාවට වඩා අද ලංකාව දුප්පත් වී ඇති හැඩයකි. අන් රටවලට සාපේක්ෂව ලංකාව සීඝ්‍ර දියුණුවකට ඉහළ විභවයක් ඇති රටකි. එහෙත් අද ලංකාව ඍණ ආර්ථිකයක හෝ ඍණ ආර්ථික වර්ධන වේගයක් ඇති අතර, තිබූ තැනිනුත් ආපස්සට යන තත්වයකට පත්ව ඇත. මෙසේ වීමට කුමන දොසා ?

කතෝලික අපිට තේරෙන ආකාරයට මෙහි ආර්ථික බංකොලොත්භාවයට එහා ගිය කාරණයක් ඇත. ඒ අධ්‍යාත්මික බංකොලොත් භාවයයි. ඉතා දැඩි ස්වාර්ථ සහිත මිනිසුන් බිහිවීම මේ ආර්ථික ව්‍යසනයට ප්‍රධාන හේතුවකි. ලංකාවේ මේ "ගේම්" ආර්ථිකය බිහිවන්නේ හැත්තෑව දශකයේ අගභාගයේදීය. තරඟ විභාග පසෙක තබා දේශපාලන හිතුවතුන්ට පත්වීම්දීම නිසා වැඩදායි දෙයක් කිරීමට හැකි සමතුන් බුද්ධිමතුන් එන්න එන්නම හිඟවූ අතර, ඔවුන් විදේශගත වීමට පෙර අවධිය ගතකරන තැනක් බවට ලංකාව පත්විය. සමාජයේ සෑම ක්ෂේත්‍රයකම, දේශපාලනීකව හිතවතුන් ඉදිරියට ගැනීමේ වැඩ පිළිවෙල නිසා පැවති ක්‍රියා පටිපාටිය වෙනස් විය. මෙය දේශපාලකයාටත් මහත් අසීරුවකි. 1977 ට පෙර, තමන්ගේ කොට්ඨාශයේ සියලු අහුමුළු පමණක් මැම්බර් මහතා හඳුනාගෙන සිටි අතර අද ඔහුට පාර්ලිමේන්තු යාමට දිස්ත්‍රික්කය පුරාම දිවිය යුතුවේ. ඉතිං කාර්ය අමාරු නිසා හඳුනන මුදලාලිවරු ඡන්ද සටනට සම්බන්ධ කරගත යුතුවිය. මෙහිදී මුදලාලිටද මේ කාර්ය අමාරුවන්නේ තම ව්‍යාපාරික කටයුතු නිසාවෙනි. ඊට විකල්පයක් ලෙස ඔහු විශ්වාසවන්ත මැර කටයුතු බාර ඊට අදාළ පිරිසි බලය ඇති අයට මෙය බාරදෙයි. බොහෝ විට මෙය ලැබෙන්නේ පාදඩ සංස්කෘතියේ නියමුවෙකුටය.

නවසිය හැත්තෑ හතට පෙර විසූ මෙම ගුණවත් දේශපාලකයා පසු කාලයේ මැරයන් පාදඩයන් සමඟ ඡන්ද සටනට එක්වන අතර කෙසේ හෝ අනෙකා පරයා මන්ත්‍රී අසුනකට පොර පිටියට පිවිසෙයි. මැතිවරණය ජයගත් පසු මැරයාටත්, මුදලාලිටත් සැළකුම් දීමට අවශ්‍ය වෙයි. ඔහු ආරක්ෂා කළ යුතු වෙයි. ඔහු වෙනුවෙන් පෙනී සිටිය යුතු වෙයි. ඔහුට ලැබෙන තනතුරු වලට හැටියට නම්බුනාම, රැකියා, ටෙන්ඩර් ලබාදීමට සිදුවෙයි. එම නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇනහිටියි. රටේ වැදගත් මූල්‍ය ආයතන වලට මිලින දහස් ගණනක් පොලු තිබ්බත්, ඒවා බොල්ණය වෙයි. නමුත් අසරණ මිනිසෙකු ගේ සාදාරණ හේතුවකට බොල්ණය පහසුකම නොමැති අතර දේශපාලන හිතවතෙකුට එය හිමිවෙයි. මේ දේවල් වාර්ථාකරන මාධ්‍යවේදීන් හඹා යාම හා අතුරුදහන් කිරීම් ඔහු කරන්නේ හිතකින් නොවේ. පෙර සිටි ගුණවත් දේශපාලකයා මේ ක්‍රමයේ ගොදුරක් වී ඔහුත් විශාල නුගගසකින් වටවූ තල් ගසක් මෙන් ක්‍රමයෙන් මිය යයි. නමුත් ඔහුගේ කය මිය යාමට මත්තෙන් අධ්‍යාත්මය මිය යනු ලබයි. හැත්තෑ හතට පෙර සිටියේ දේශපාලකයා සහ ඡන්දදායකයා පමණි. පසුව ඒ මැදට මුදලාලි එකතු විය. ඉන්පසු මුදලාලි දේශපාලකයා විය ඔහුට සහය දුන් පාදඩයා මුදලාලි විය. වර්තමානය වන විට බොහෝ දුරට පාදඩයා දේශපාලකයා වී සිටියි. මනා දේශපාලන සාක්ෂරතාවයක් නැති, දේශපාලනය නිරවද්‍යතාවයක් නැති පිරිසක් අපව පාලනය කරමින් සිටිති. ඔවුන් එතෙරවී ඇත. එහෙත් ජනතාව තවම මෙතෙරය. පොරොන්දු දේශය පේන මානයක් නැත. අපි තවම ඔවුන් පෙන්වන කෙම්බිම සොයා කාල්ගාමු. අද කතෝලික දේශපාලකයන් හා ඔවුන්ගේ සමීප අයවලුන්ට පශ්චාත්තාප වී හොඳ කොම්සක් කර ගැනීමට කාලය එළඹ ඇත.

මේ අධ්‍යාත්මික පරිහානියට අප සැම දෙනාමත් වගකිය යුතුවේ. සොදෙම් හා ගොමෝරා විනාශ කිරීමට ප්‍රථම දෙවියන්වහන්සේ අසන ප්‍රශ්නය අද අපෙනුත් අසනු ලැබේ. ඒ ඔබ අතර කොපමණ දැහැමි අය සිටිනවාද යන්නයි. සොදොම් ගොමෝරා වල එය දහයක්වත් නැත. එහෙත් අප අතර කොපමණද ? එය ඉතා අඩු අගයක පවතී. ජනතාව දැහැමි නොවනතාක් අර්ථික පාස්කුව එතෙර විය හැකිනොවේ. හොරට කිරන තරාදි, බාල බෙහෙත්, නුසුදුස්සන් පත්කිරීම්, ඥාති සංග්‍රහයන්, මහා පරිමාණ වංචා, දූෂණ රට වෙලාගෙන ඇත. තාරුණ්‍ය හරසුන් වී ඇත්තේ ඔවුන්ට හිමිතැන් වියපත් කෑදර මිනිසුන් තවදුරටත් අල්ලාගෙන සිටින නිසාවෙනි. වැඩියෙන් සිටි පලියට වැඩිහිටි වන්නේ නැත. එය නව පරපුරක් බිහිකිරීමට උරදුන් පීතෘක හා මාතෘක කර්තව්‍යයක් විය යුතුය. පිළිවෙතින් පෙළ ගැසෙමු. අධ්‍යාත්මිකව හරි දේ කරමු. පෞද්ගලිකව අධ්‍යාත්මය එතෙර කරමු. එවිට සමාජ ආර්ථිකය එතෙර වනු ඇත.



**"කතෝලික අපිට තේරෙන ආකාරයට මෙහි ආර්ථික බංකොලොත්භාවයට එහා ගිය කාරණයක් ඇත. ඒ අධ්‍යාත්මික බංකොලොත් භාවයයි. ඉතා දැඩි ස්වාර්ථ සහිත මිනිසුන් බිහිවීම මේ ආර්ථික ව්‍යසනයට ප්‍රධාන හේතුවකි. "**

**එම අවිහිංසාවාදියා දසවද දී එල්ලා මරා දැමීමට තරම් ඔහු කළ වරද කුමක්ද ?**



# ඒ ඓතිහාසික ඝාතනය

**පද්මා පැඩ්ඩිලියන්**
ලූර්දු දේව මාතා දේවස්ථානය, රද්දොළුගම

එදා මෙදා තුර ශත වර්ෂ 20 ක් තිස්සේ මේ ලෝකයේ වඩාත් කථා බහට සහ සැමරීමට ලක් වන යම් කිසි ඝාතනයක් ඇත්නම්, ඒ මීට වසර 2000 ට පමණ පෙර මරා දමනු ලැබූ ජේසුස් ක්‍රිස්තුන්ගේ ඝාතනය පිළිබඳවයි.

එම ඝාතන වාර්තාව කෙටියෙන් මෙසේය.

දහසක් වද දී සිරුර අඩ නිරුවත් කොට කස පහර දෙමින්, අධික ලෙස රුධිරය වෑහෙන්නට සලස්වා සිරුර අඩපණ කරන ලදී.

එලෙස අනේක විධ ශාරීරික පීඩාවලට ලක් කළ එම අවිහිංසා වාදියාට වැටී වැටී කුරුසියක් කරතබා ගෙන කල්වාරි කන්ද නැගීමට සලස්වා ඇත.

බලවතුන්ගේ මන දොල පුරවමින් සාධාරණ ලෝකයා මෙන්ම සොබා දහමද ඉමහත් කම්පාවට පත් කරමින් කුරුසිය මත අත් සහ පාද තබා අඟල් 6 ක පමණ ඇණ වලින් සිදුරු කොට එල්ලා මරා දමන ලදී.

එලෙස එම අවිහිංසාවාදියා දසවද දී එල්ලා මරා දැමීමට තරම් ඔහු කළ වරද කුමක්ද?

සමාජ සාධාරණය ගැන ජනතාවට කියා දීමයි. ජේසුස් ක්‍රිස්තුන් මෙලොවට මාංශගත වූයේ අසරණ වූ ජනතාව මුදවා ගැනීමටය. අඳුරෙන් පිරුණු ලෝකයට ආලෝකය දීමටය.

ප්‍රභූ පැලැන්තිය සසළ කරන්නට තරම් ජේසුස් ක්‍රිස්තුන් සිදු කළේ කුමක්ද?

ජනතාවට අලුත් ආකාරයට සිතන්නට කියා දීම.

විවිධ දේශනා මඟින් ඔවුන්ට යහමඟ පෙන්වීම.

> "සමාජ සාධාරණය ගැන ජනතාවට කියා දීමයි. ජේසුස් ක්‍රිස්තුන් මෙලොවට මාංශගත වූයේ අසරණ වූ ජනතාව මුදවා ගැනීමටය. අඳුරෙන් පිරුණු ලෝකයට ආලෝකය දීමටය."

යහපත් ජීවිත ගත කිරීමෙන්, දෙවියන්වහන්සේ වෙතට ළංවිය හැකි බවත්, මෙලොවෙදී ගෙවන ජීවිතය එතනින් නතර නොවන බවත් ඉගැන්වීම.

එම තත්ත්වයන් සමාජයේ ප්‍රභූන්ට මෙන්ම දිළිඳුන්ට ද ලබා ගත හැකි බවත් ප්‍රකාශ කර සිටීම.

දිළිඳුකම උරුමයක් නොවන බවත්, දෙවියන්වහන්සේ මඟින් ශක්තිමත් විය හැකි බවත් කියා දීම. "ඉල්ලන්න ඔබට ලැබේ. සොයන්න ඔබට සම්බවේ."

මිනිසාට මානසික ශාරීරික පීඩා වලින් මිදිය හැකි අයුරු ඉගැන්වීම.

ශක්තිමත් ඇදහිල්ල මත දෙවියන් වහන්සේගෙන් ඕනෑම ආශිර්වාදයක් ලබා ගත හැකි බව.

තමාගේ අවශ්‍යතාවයන් සඳහා ලෞකික අය මත රැඳෙනවට වඩා දෙවියන් මත විශ්වාසය තබන ලෙස කියා දීම.

මානව දයාව, සමානාත්මතාවය, ප්‍රේමය, දයානුකම්පාව ගැනද කියා දීම

හෙට දවස ගැන කරදර නොවන ලෙසත්, සියලු කරදර දෙවියන් වහන්සේට බාර දෙන ලෙසත් කීම.තමා පැමිණියේ නිරෝගී අය සඳහා නොව රෝගී අයට සේවය කිරීමට බව පැවසීම.

වෙහෙසවන, බර උසුලන, පීඩාවට පත්ව සිටින අයට සහන සලසන බව කීම.

එසේම තමා දේව පුත්‍රයා බව ඔප්පු කරමින්, මළවුනට පණ දීම, අන්ධයින්ට පෙනීම දීම,කොරුන් ඇවිද්ද වීම, රොටී 5කින් 5000 ක් ජනතාවගේ කුසගිනි නිවීම, ආදී ප්‍රාතිහාර්යය සිදු කිරීම, පව් කමාව ගැන කියා දීම.

ජනතාවට ආලෝකයක් වීම

ජේසුස් වහන්සේගේ මේ සෑම ක්‍රියාවක් මඟින්ම පීඩිත ජනතාවට මානසිකවත්, ශාරීරිකවත්, අධ්‍යාත්මිකවත් ශක්තිය දෙමින්,හෙට දවස ගැන බිය නොවිය යුතු බව කියාදීමටද වැදගත් යහපත් සේවාවක් විය.

ප්‍රභූන් කැලඹීමට පත්වීම

මෙම ඉගැන්වීම් සහ අවංක ක්‍රියාවලිය තුළ,ජනතා හිතවාදී මෙම අවිහිංසාවාදියා වටා දහස් ගණනින් ජනතාව ඒකරාශී වීම දරා ගත හැකි නොවීය.

එහි අවසාන ප්‍රතිඵලය වූයේ ජනතාව වෙනුවෙන් කැපවුණු ජේසු තුමාට විවිධ ව්‍යාජ චෝදනා ඉදිරිපත් කර දස වද දී මරා දැමීමයි.

එම සත්‍යයේ හඬ නිහඬ වීද ?

කිසිසේත්ම නැත. එතුමා ඉදිරිපත් කළ එම දහම අද ද ජීවමානය. එතුමා මරා දැමූ ප්‍රභූන්, පූජකයින් හෝ රෝම අධිරාජ්‍යය වියැකී ගොස් ඇත.

එහෙත් මරණය හිසේ දරාගෙන ජනතාව වෙනුවෙන් කළ එම මෙහෙවර ජීවමානය. එතුමාද උත්ථාන වී අප අතර සිටී.

එම ඝාතනය සිදු නොවීනම් උත්ථානයක්ද නැත. ක්‍රිස්තු ධර්මයක්ද නැත.

: අද අපිද විවිධාකාර ගැටළු වලින් පීඩා විඳිමු ! එහෙත් මරණය ජයගෙන උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සැමදා අප අතර සිටින බැවින්, එම ප්‍රශ්න වලට මුහුණ දීමට උන්වහන්සේ අපට ශක්තිය, හැකියාව ලබා දෙන සේක. අප ආරක්ෂා කරන සේක.



# සමිඳු දහම පැතිරීමට ශ්‍රාවකයන් තුළ විශාල ජීවිත පෙරළියක් කළ පාස්කුව

**ඊ. හිල්ඩා වයලට් ප්‍රනාන්දු**
සා. පිලිප්නේරි දේවස්ථානය, උදම්මිට


සමිඳාණන් වහන්සේ ගලීලයේ මුහුදුබඩ ඇවිදිමින්ද, කඳුකරයට වැඩම කරද්දීද ගෝලයන් දොළොස් දෙනෙකු තෝරා පත්කර ගත් සේක. උන්වහන්සේ එසේ කළේ ඔවුන් තමන් හා සමඟ සිටින පිණිසත් සුභඅස්න දේශනා කිරීමට යවන පිණිසත්, දුෂ්ඨාත්මයන් සුව කිරීමේ බලයද ඇතිව සිටින පිණිසත්වය. උන්වහන්සේ ඔවුන් කැඳවා ගත්තේ මා අනුව එන්න කියාය. තමන්ගේ දැල්, ආම්පන්න සියල්ල අතහැර දමා ඔවුහු ස්වාමීන් වහන්සේ පසුපස ගමන් කළහ. ඔවුන් සියල්ලෝම ධීවරයෝ වූහ. සමිඳාණන්ගේ දුක් ප්‍රාප්තියට පෙර දින එනම් මහ බ්‍රහස්පතින්දා මේ ගෝලයන් දොළොස්දෙනා සමග උන්වහන්සේ අන්තිම රාත්‍රී භෝජනයද අනුභව කළ සේක. ඒ මොහොතේම උන්වහන්සේ දිව්‍යසත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කලේ රොටී කඩා, ආශිර්වාද කරමින් ද මිදී යුෂ කුසලාන තුති පුද දෙමින්ය. එලෙසම උන්වහන්සේ මේ සිදු කළ දෙය "මා සිහිකිරීම පිණිස මෙය කරන්නයැ" යි ගෝලයින්ට වදාළ සේක. ඒ අතරම ඔවුන්ට බැහැපත්කම ඉගැන්වීම සඳහා ද ඔවුන්ගේ පාද ද උන්වහන්සේ සේදූ සේක. එලෙස උන්වහන්සේ සූදානම් වූයේ තම පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමට ය. එනම් මුළු විශ්වයම පාපයෙන් මුදා ගැනීම සඳහා ය.

ඒ සඳහා උන්වහන්සේට කුරුසියේ ජීවිතය පූජා කිරීමට සිදුවිය. දුෂ්ඨ ජුදයෝ උන්වහන්සේගේ කරපිට බරවූ ලී කුරුසියක් පටවා, සිරසට කටු ඔටුන්නක් පළඳවා, කස පහර දෙමින්, නොයෙකුත් වදගාවිනා වලට පත් කරමින්, කල්වාරියට ඇදගෙන ගොස්, දෑතත්, දෙපයත් කුරුසිය තබා ඇණ ගසා මරණයට පත් කළෝය. එහෙත් මේ මරණය මරාගෙන උන්වහන්සේ ජීවමානව උත්ථානවූ සේක. සතියේ පළමුවන දින හිමිදිරි උදයේ සුවඳ ද්‍රව්‍ය රැගෙන ස්ත්‍රීහු සොහොන් ගෙය ළඟට ගියහ.

එහෙත් එතන තිබූ ගල සොහොන් ගෙයින් ඉවතට පෙරළා තිබෙනු දුටුවෝ ය. ඒ දුටු ඔවුන් බියපත්වූ විට කාන්ති විහිදුවන වස්ත්‍ර හැඳගත් මනුෂ්‍යයෝ දෙදෙනෙක් ඔවුන් ළඟ සිටිය හ. ඔවුහු කතාකොට "ජීවමාන තැනැන්වහන්සේ මළවුන් අතර සොයන්නේ මන්ද? උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ උත්ථාන වූයේ යැයි" කීය. එය දැනගත් විගස ඔවුන් පැමිණ ශ්‍රාවකයන්ට එපවත් කීහ. පේදුරු නැඟිට සොහොන් ගෙය ළඟට දුවගොස් නැමී බලා හණ රෙදි පමණක් තිබෙනු දැක සිදුවූ දේ ගැන පුදුම වෙමින් සිය නිවසට ගොස් ජුදෙව්වරුන්ට බියෙන් දොරවල් වසා ගෙන සිටියහ. මේ අතර උත්ථාන වූ ජේසුස් වහන්සේ, ඔවුන් දොරවල් වසා ගෙන සිටි තැනට වැඩම කර, "ඔබට ශාන්තිය වේවායි" වදාළ සේක. උන්වහන්සේ මෙසේ වදාරා තමන් අත් ද ඇලය ද ඔවුන්ට පෙන්වූ සේක. ශ්‍රාවකයෝ සමිඳාණන් වහන්සේ දුටුකළ ප්‍රීතියෙන් පිනා ගියහ. "ඔබට ශාන්තිය වේවායි" යළිත් උන්වහන්සේ ඔවුන්ට වදාළා "පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන් මමද ඔබ යවමි යි" ඔවුන්ට කී සේක. උන්වහන්සේ ඉක්බිති ඔවුන් පිට හුස්ම හෙළා "ශුද්ධාත්මයාණන් පිළිගන්න. ඔබ යමකුගේ පව් කමා කරන්නහුද ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ. ඔබ යමෙකුගේ පව් කමානොකරන්නහුද ඒවා කමා නොකරනු ලැබේ" යැයි ඔවුන්ට වදාළ සේක. (ශු.ජොහාන් 20:19-23).

උන්වහන්සේ මේ අන්දමින් උත්ථානයෙන් පසු 40 දවසක් අතරතුර ඔවුන්ට දර්ශනය වෙමින්ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන දේශනා කරමින්ද, උන්වහන්සේ ජීවමානව ඔවුන්ට ප්‍රකාශ වූ සේක. උන්වහන්සේ ඔවුන් සමඟ ආහාර වළඳමින් සිටිය දී, ඔවුන් අමතා "ඔබ ජෙරුසල මෙන් ඉවත්ව නොගොස් මා වදාළ පරිදි පියාණන් වහන්සේගේ පොරොන්දුව බලාපොරොත්තුවෙන් සිටින්න. තවද ජොහාන් වතුරෙන් බෞතිස්ම ස්ථාපනය කළේය. එහෙත් මින් නොබෝ දවසකින් ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් බෞතිස්මය ස්නාපනය කරනු ලබන්නේ යැයි" වදාළ සේක. (ක්‍රියා 1:3-5) ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කල ඔබ බලය ලබන්නහුය. එවිට ඔබ ජෙරුසලමෙහි ද, මුළු ජුදයෙහි ද, සමාරියෙහි ද, පොළොවේ සීමාන්තය දක්වා ද, මාගේ සාක්ෂිකාරයෝ වන්නහු යැයි වදාළ සේක. උන්වහන්සේ මෙසේ වදාරා ඔවුන් බලා සිටියදීම ඔසවා ගනු ලැබ වළාකුලකින් වැසී නොපෙනී ගිය සේක. (ක්‍රියා 1:8-9) ඉන්පසු ඔවුහු ස්ත්‍රීන් ද, මරියතුමිය ද සමඟ නොකඩවා යාච්ඤාවේ යෙදුණහ. දින දහයක් ගතවූ ඉක්බිති මේ සියල්ලෝම මෙසේ යාච්ඤාවේ යෙදී සිටියදීම සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬකින් ඔවුන් සිටි ගෙය මුළුමනින්ම පිරී ගියේය. ගිනිදළු වැනි දිව් බෙදීගොස් ඔවුන් එකිනෙකා මත පතිත විය. ඒ මොහොතේ ඔවුහු ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව අන්‍ය භාෂාවලින් කතා කරන්නට පටන් ගත් හ. එකල හැම රටකින්ම පැමිණි බැතිමත් ජුදෙව්වරු මේ ශබ්දය ඇසී එක්රැස් වූහ. එම කතා ඔවුන් එකිනෙකාට තම තමන්ගේ මව් බසින් තේරුම් ගත හැකි වූ නිසා ඔවුහු වික්ෂිප්ත වූහ. මේගැන බොහෝ දෙනා විශ්මිත වී වියවුල් වූ අතර මොවුන් අලුත් මිදියුෂ පමණට වඩා බී ඇතැයි කීහ. එහෙත් පේදුරු

16 පිටුවට >>>



# සමාව දීම

**ලුෂාන් ෂර්ලි පෙරේරා**
ගෝනවල, කැළණිය.

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීම, මරණය (ඝාතනය) සහ උත්ථානය සිහිපත් කරන තවත් පාස්කු සමයකට අප අවතීර්ණ වී සිටිමු.මේ වන විට අප එකිනෙකාගේ වයස් ප්‍රමාණය අනුව පාස්කු සමයන් කීයක් පසු කර ඇතිද? එහෙත් ජේසු තුමන් තුළ වඩා වැදගත් වන්නේ, ලී කුරුස කර තබාගෙන හඬමින් ශෝක වෙමින් එතුමන්ගේ දුක් ප්‍රාප්තිය සිහිකිරීමෙන් එහාට ගිය අප ජීවිත පාපයෙන් එතෙර කරන සැබෑ පාස්කු අත්දැකීමකි. මෙයට ඔබ මා සූදානම්ද? යනු සම්ප්‍රදායානුකූල ප්‍රශ්නයකි.

ජේසු තුමන් සකල මනුෂ්‍ය සංහතියේ පාපයන් උදෙසා යාගයක් බවට පත් වූ සේක. උන්වහන්සේගේ ශ්‍රී රුධිරයේ බලයෙන් අපට පාප සමාව ලබාදී, සදාතන විමුක්ති මාර්ගය විවර කර දුන් සේක. එබැවින් අපි ඇදහිල්ලෙන් මෙන්ම ක්‍රියාවෙන් ද ධර්මිෂ්ට විය යුතු වෙමු.

දේව වචනයේ සුවිශේෂී තැනක් හිමිවන "කමාව දීම" කිතු තුමන්ගේ ඉගැන්වීමේ ප්‍රධානතම තේමාවක් වෙයි.එනිසා අප එකිනෙකාගේ වැරදි අඩු පාඩු වලට කමාව දානය කළ යුතු වෙමු. අනෙකාට කමාව නොදෙන්නා ස්වර්ගයට නුසුදුස්සෙකි. අපට වැරදි කරන අයට අප කමා කරන්නාක් මෙන්, අපගේ වැරදි වලටද කමා කළ මැනව" කියා යදිනවාසේම එය ක්‍රියාවටද නැංවිය යුතුය.අප සැබෑ දේව දරුවන් වන්නේ එවිටයි.

පරණ ගිවිසුමේ ද්විතීය කතාව-15 පරිච්ඡේදයේ 1-8 පදවලින් දැක්වෙන පරිදි සෑම වසර හතක්ම(07) අවසානයේදී අසල්වැසියාට ණයට දී ඇති දේ නැවත අය නොකරන ලෙස නියම කර තිබේ.මෙහි මූලික අරමුණ වූයේ කමාව දීම හරහා දිළිඳුකම තුරන් කිරීමය. ජේසු තුමන් සිය ශ්‍රාවකයන්ට උගැන්වූ "ස්වර්ගයේ වැඩ සිටින" යාච්ඤාව අප මුවින් උදේ සවස මිමිණුවත් එම වචන අප ක්‍රියාවට නංවා ඇතිද? යනු ප්‍රශ්නයකි. දේව වචනයට අනුව ක්‍රියාව නැති ඇදහිල්ල නිෂ්ඵලම ඇදහිල්ලකි.

අප අන් අයට සමාව දෙන විට ස්වර්ග යෙහි වැඩසිටින දෙවි පියාණන් වහන්සේ අපටද සමාව දෙන බවත්, අප එසේ අන් අයට සමාව නොදෙන්නේ නම් උන්වහන්සේ ගෙන් අපටද සමාව නොලැබෙන බවත් ශු.මතෙව් 6:9-15 පදවලින් විස්තර වෙයි.


කෙසේ වෙතත්, එකිනෙකාට කමාව දීම මුළු සිතින්ම ඉටුකිරීම ලෙහෙසි කරුණක් නොවේ. ස්වභාවයෙන්ම අප තුළ පවතින පාපී සිතුවිලි අනෙකාට කමාව දීම කල්දමයි. ඒ වෙනුවට පලි ගැනීමට සැලසුම් කිරීම අප සමාජයේ සාමාන්‍ය දෙයක් බවට පත් වී ඇත. "පාපය" කමාව දීම වළකයි. අන් අයට කමාව දීමට තරම් අපගේ සිත් නම්‍යශීලී වන විට එයම අපේ ජීවිත සුභවාදී හා වාසනාවන්ත ආලෝකයක් බවට හැරවෙන සන්ධිස්ථානය බවට පත්වෙයි. කමාව දීම එතරම්ම ප්‍රබල ක්‍රියාදාමයකි. අන් අයට කමාව නොදෙන විට සාමය ගිලිහී යන අතර සිත තුළ මානසික ආතතිය, වෛරය, හුදෙකලා බව වැනි හැඟීම් වර්ධනය වී සෞඛ්‍යයට ද ඒවා දැඩි ලෙස බලපායි.

ජේසුතුමන්ගේ ප්‍රධාන ගෝලයා වූ පේදුරුතුමන්ට කමාව දීම පිළිබඳව ප්‍රශ්නයක් ඇතිවී එය උන්වහන්සේ වෙතට ඉදිරිපත් කළ අයුරු ශු.මතෙව් 18:21-35 පද විස්තර කරයි. ඔහු එතෙක් සිතා සිටියේ සත් වරක් පමණක් සමාව දීම සෑහෙන බවය. එහෙත් ජේසුතුමන්ගේ පිළිතුර වූයේ අප අනෙකාට සැත්තෑවර සැත්තෑවක් කමාව දිය යුතු බවය. අප අතරින් කී දෙනෙක් මෙසේ අන් අයට කමාව දැක්වීමට සූදානමින් ද?.

ඔබ තුළ කමාව දීමත්, දේවප්‍රේමයත්, ස්ථිර වශයෙන්ම තිබේනම් සමාජය විසින් අත්හැර දමා ගොස් සිටින සහෝදර සහෝදරියන් සොයා ඔබ යනු ඇත. ඔබට ඔවුන්ගෙන් සිදු වූ වැරදිවලට කමාව දී නැවත ඔවුන් සමඟ සහෝදර ප්‍රේමයකින් කටයුතු කරන්නේ නම් දෙවි පියාණන් ඔබගෙන් බලාපොරොත්තු වන දේ ඉටු කළා වෙයි.එහෙත් කෙනෙකුට සමාව දී පෙර පරිදි ඇසුරු නොකොට අතේ දුරින් තබා කටයුතු කරන්නේ නම් ඔබගේ සියලු යාච්ඤා නිෂ්ඵල බව සිහි තබාගන්න. පූජාසනය වෙත පැමිණෙන පඬුරු ඔප්පු කිරීමට පෙර තම සහෝදරයා සමඟ අමනාප වී සිටින්නේ නම් ඔහු සමග සමගි වී පඬුරු ඔප්පු කිරීම කළ යුතු බව දෙවිඳුන් ශු.බයිබලයේ දේව වචනය හරහා ප්‍රකාශ කරන සේක.

දෙවිඳුන් යනු ප්‍රේමයයි. ජේසුතුමන් පාපයෙහි ගිලී සිටින මිනිසාට කමාව දුන් විට මුළු ලොව පුරාම දේවප්‍රේමය පැතිර ගියේය. රෝම සෙබළුන් තමන් වහන්සේ කුරුසයට තබා ඇණ ගසන විට

16 පිටුවට >>>



## සමිඳු දහම පැතිරීමට ශ්‍රාවකයන් තුළ විශාල ජීවිත පෙරළියක් කළ පාස්කුව

14 පිටුවෙන්

ශබ්ද නගා කතාකොට ඔවුන්ට කීවේ තවම වේලාව උදේ නවය බැවින් ඔබ සිතන ලෙස කවුරුත් වෙරි වී නැති බවයි. ඒ තරමට මේ ශ්‍රාවකයන් ශුද්ධාත්මයාණන් තුළින් බලවත් වී සිටියහ. ඔවුහු පේදුරුගේ දේශනා අසා සිත් වෙනස් කරගෙන කුමක් කළ යුතුදැයි ශ්‍රාවකයන්ගෙන් ඇසූහ. "ඔබ පසුතැවී සිත් හරවාගෙන පව්කමාව ලැබෙන පිණිස ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බෞතිස්ම ස්නාපනය ලබන්න. එවිට ඔබ ශුද්ධාත්ම දීමනා ලබන්නහුය. එවිට ඔවුන්ගේ වචනය පිළිගත් අය බෞතිස්ම ස්නාපනය කරනු ලැබූහ. ඒ දවසේදීම 3000 ක් පමණ පුද්ගලයෝ ඔවුන්ගේ සංඛ්‍යාවට එකතු වූහ. (ක්‍රියා 2:37-41)

ඉන්පසු සියල්ලෝම ශ්‍රාවකයන් සමඟ එක්වී රොටී කැඩීමෙහි ද, යාච්ඤාවෙහි ද, නිරතව කල්ගත කළහ. ඔහු සියල්ලෝම එක්වී හැමදෙයම පොදුවේ තබා ගත්හ. තම තමන්ගේ ඉඩ-කඩම් හා දේපළ පවා විකුණා එකිනෙකාගේ අවශ්‍යතාවන් හැටියට සියලු දෙනා අතර බෙදා ගත්හ. ඔවුහු දිනපතා නොකඩවා දේව මාලිගාවේ රැස්වෙමින් ද, ගෙයින්-ගෙට යමින් රොටී කඩමින්ද, ආහාර බෙදා ගනිමින්ද, දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් ද ප්‍රීතියෙන් කල් ගෙවූහ. මෙසේ සමිඳුන් තුළ එක්වූ සංඛ්‍යාව දවසින් දවස වැඩිවන්නට විය. තවද, පේදුරු හා ජුවාම් යාච්ඤාව සඳහා දේවමාලිගාවට පිවිසෙද්දී දොරකඩ සැමදා සිඟමන් යදිමින් සිටි කොරෙකුව පේදුරු විසින් සුවපත් කරන ලදී. පේදුරු ඔහුට කීවේ ඔබට දෙන්න රන්වත් රිදීවත් මට නැත. එහෙත් දෙවියන් වහන්සේගේ නාමයෙන් ඔහුට ඇවිදින්නයි කීවේය. එකෙනෙහිම ඔහුට ඇවිදීමට හැකි විය. ශ්‍රාවකයන් ජනයා අතර බොහෝ අරුම පුදුම දේ සිදුකළහ. මේ ක්‍රමයෙන් සමිඳාණන් වහන්සේ හඳුනා ගත් සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩි වන්නට විය. පේදුරුගේ සෙවනැල්ල පවා රෝගීන් මතට වැටෙන ලෙස රෝගීන්ව යහන්වලද පැදුරු මතද ගෙනත් තැබූහ. දෙවියන් වහන්සේගේ වචනය පැතිර යාම නිසා ජෙරුසලමේ ශ්‍රාවකයන්ගේ ගණන වැඩිවනවාත් සමගම පූජකයන්ගෙන් ද මහත් සමූහයක් ඇදහිල්ල පිළිගත්හ. කතෝලිකයන්ට පීඩා කළ ඔවුන් මරණයට පත් කළ සාවුල්ද සමිඳානන්ගේ බලය නිසා ජීවිතය වෙනස් කරගෙන ඔහු ද ශ්‍රාවකයෙකු විය. ඔහු පාවුළු වී කොරවූ මිනිසකුද සුවපත් කළේය. එහෙත් ඔවුන්ට නොයෙකුත් ලෙස තාඩන පීඩනවලට මුහුණ දෙන්නට සිදු විය. ඒ සියල්ල අභිබවා ඔවුහු සුභඅස්න දේශනා කරමින්ද නොයෙකුත් හාස්කම් හා ලකුණු පෙන්නමින්ද තමන්ගේ දේව කාර්‍ය නිසි ලෙස ඉටු කළහ. මුළු විශ්වය පුරාම ඔවුහු ධර්මය ප්‍රචාරය කළහ. අද මුළු විශ්වය පුරාම පැතිර පවත්නේ සමිඳාණන් තුළ ඔවුන් දෙසූ දහමයි. ලෝකයේ අස්සක් මුල්ලක් නෑර සෑම තැනකම පාහේ කතෝලික ආගම පැතිර යාමට හේතු වුණේ මේ ශ්‍රාවකයන් ලබාගත් ශුද්ධාත්ම බලයයි. ඔවුන්ගේ බලවත් විශ්වාසයයි.

සමිඳාණන්ගේ උකුත් වීම, උත්ථානය, ස්වර්ගාරෝහණය, ශුද්ධාත්ම ආගමනය පෙරදැරි කරගෙන මේ ශ්‍රාවකයන් නොබියව ඉදිරියට ගමන් කරමින් උන්වහන්සේ ගෙනා දහම ශ්‍රාවකයන් මෙසේ පණ ගන්වූහ. මේ සඳහා ඔවුන්ට පන්නරයක් වූයේ සමිඳුන්ගේ පාස්කුව තුළින් ඔවුන් තුළ ඇති වූ අති විශාල ජීවිත පෙරළියයි. ඔවුන්ගේ මේ ක්‍රියා පටිපාටිය ලෝකය තුළ අවසානය දක්වාම ඵල දරනු ඇත. මෙසේ සමිඳු ගෙනා දහම ලොව පුරා ව්‍යාප්ත වූයේ මේ ශ්‍රාවකයන් තුළ පාස්කුවේදී ඇති කළ මහා ජීවිත පෙරළියයි. කිතුමන් තුළ යැපෙන සියල්ලන් හට සුබ පාස්කු මංගලයක් වේවා!

## දූවිල්ලෙන් සෑදුනු නුඹ

අළු බදාදායින් ආරම්භ වන චතාරික කාලයේදී "දූවිල්ලලෙන් සෑදුනු නුඹ දූවිල්ලටම හැරෙන්නේය" යන වාක්‍යය මෙනෙහි කරමින් ගරු පියතුමා දිව්‍ය යාගයේදී අප සැමගේ නළල මත අළු තවරමින් මෙනෙහි කරයි. එදිනෙදා ජීවිතයේදී මේ බව සිතට ගෙන කටයුතු කරන්නේ කීදෙනාද ?

යම් දිනක අළු දූවිලි බවට පත් වී මහපොළවට දිරායන අපගේ ශරීරය ගැන අප උවමනාවටත් වඩා උනන්දුවන අවස්ථා එමට ය. ඒ සඳහා නිකරුනේ වියදම් කරන මුදල් අපමණය.තම ශරීර සුබ විහරණය සඳහා අධික මිල ගණන් යටතේ ඇති සුවඳ විලවුන් යනාදියට නිකරුනේ වැය කරන මුදලින් විශේෂයෙන් මේ චතාරික සමයේදී අන් අය වෙනුවෙන් පරිත්‍යාග කිරීමට උනන්දු වෙමු. කුසට අහරක් නැතිව,ගතට ඇඳුමක් නොමැතිව,
රැකියා අහිමිවීම නිසා තම දරු පවුල් නඩත්තු කිරීමට නොහැකිව, රෝගාබාධ වලට බෙහෙත් ගැනීමට මුදල් නොමැතිව අන්ත අසරණව දුක් විඳින අපේම අසල්වැසියා ගැන සොයා බලා කටයුතු කරමු. අපිදු යම් දිනක මෙලොවින් සමුගෙන යා යුතු බවත් අපි කළ හොඳ, නරක පමණක් ගෙන යන බවත් අප ශරීරයද දූවිල්ලටම හැරී මහපොළවට දිරාපත්වන බවත් සිතට ගෙන කටයුතු කිරීමට උත්සහ ගනිමු.

**හිල්ඩා කුමාරපේරු**
නො.447, පුස්කොළදෙනිය, ගිරිඋල්ල.

## නවමු පණක් ලබා නව ලොවකට පිය නගමු.

ක්‍රිස්තු උත්ථාන වීමේ මංගල්‍යය ජන වන්දනා වසරේ වඩාම උත්කෘෂ්ටවත් මංගල්‍යයකි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උත්ථාන දිනය මිනිස් ඉතිහාසයේ ඉතාමත් ප්‍රීතිජනක, සතුට උපදවන දිනයකි. මානුෂිකව සිතන කළ මිනිසාගේ ජීවිතයේ අවසානය මරණයෙන් කෙළවර වුනත්, කිතුනු අපගේ ඇදහිල්ලට අනුව එය ජීවිත ගමනේ නව පටන් ගැනීමකි. මරණයට පත්වූ කිසිවකු මීට පෙර උත්ථාන වූයේ නැත. මන්දයත් මිනිසාට මරණය පරාජය කිරීමට නොහැකි හෙයිනි. මිනිස් අපේ ම වරදට කෲර වද විඳ තම ප්‍රාණය පුදදුන් ජේසුස් වහන්සේගේ විජය ග්‍රහණයෙන් පාපයේ දොරගුළු බිඳ දමා නව ජීවිත මාර්ගයක් අපට පෙන්වා දී ඇත. එබැවින් අපගේ ජීවිතවල ඇති ක්‍රෝධය, වෛරය, ඊර්ෂ්‍යා ව, අසමගිය ආදී වහල් දොරටු බිඳ හැරදා උත්ථානයක් අප ජීවිත වලට ළඟා කර ගනිමු. පසුගිය ප්‍රශ්න, කරදර ඉවතලා, උත්ථානවූ ජේසු සමිඳුන් තුළ නව ජීවිතයකට පා නගමු. එලෙස නව ජීවිතයකට එතෙර වී අපිදු ක්‍රිස්තු උත්ථානයේ සාක්ෂි කරුවන් වන්නට වෙර දරමු.

**ලේඛිකා - ප්‍රියන්ති මෙන්ඩිස්**
මෙදර්, නො 116/1, ගාළු පාර, උතුරු පයාගල.

## සමාව දීම ...

15 පිටුවෙන්

ඔවුන් නොදැන කරන වරදට කමා කළ මැනවයි පැවසීමට තරම් ජේසුස් වහන්සේගේ කමාව දීම ප්‍රබල විය. අති මහත් විය.උන්වහන්සේ මළවුන් කෙරෙන් නැගිටීමෙන් පසු මුහුදු වෙරළේදී පේදුරු තුමන්ට දර්ශනය වී ඇසුවේ, "ඔබ මට ප්‍රේම කරන්නේද?" යනුවෙනි. තුන්වෙනි වරටත් ඔහුගෙන් එසේ ඇසූ විට පේදුරු තුමන්ගේ මුලු ආත්මයම කැළඹී දැවී යන්නට විය. පේදුරු තුමන්ගේ දැඩි සිත ඉටි පිඬක් මෙන් උණු විය.

ජේසුස් වහන්සේ දේශනා කළේ ප්‍රේමය, නිදහස, සාමය හා සමානාත්මතාව ගැනය. එනිසා උන්වහන්සේගේ උත්ථානය සමරණ කිතුනු අප එවන් වූ ධර්ම ගුණාංගයන්ගෙන් සපිරුණු යුක්තිය, සාධාරණත්වය ධර්මිෂ්ටකම රජයන දේවරාජ්‍යයේ වටිනාකම් ජීවත් කරවන සැබෑ ක්‍රිස්තු ශ්‍රාවකයන් ලෙස ක්‍රියා කිරීම මේ යුගයේ අත්‍යවශ්‍ය කටයුත්තක් වන්නේය. මන්ද,ජේසුස් වහන්සේගේ පැතුම වූයේ "දිග් විජයක්" නොව "ධර්ම විජයක්මය".



# සැබෑ එතරවීමකට සූදානම් වෙමු

පාස්කුව යනු කතෝලික ජනවන්දනාව තුළ උතුම්ම මංගල්‍යයකි. පාස්කුව ගැන කතා කරන විට ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය අමතක කල නොහැක. උන්වහන්සේ එදා කල්වාරියෙදි රුධිරය හෙලමින් දුක් වින්දේ මිනිස් සමාජය පාපී බව තුරන් කර ඔවුන්ට ගැලවීම ළං කරදීමටය. මේ සඳහා අප නැවත හැරී බැලිය යුතුය. අප පැමිණ සිටින්නේ ඉතාමත් අභාග්‍ය සම්පන්න කාල පරිච්ඡේදයකටය. මව දුවට, පියා පුතුට, සහෝදරයා සහෝදරියට එරෙහිව සටන් වදින කාලයකටය අප පා තබා ඇත. අමු අමුවේ කිරි දරුවා පටන් මහල්ලා දක්වා මරාදමන කාලයක් තමා මේ එළඹී ඇත්තේ. මිනිසා තුළ ඇතිවිය යුතු සාරධර්ම කෙලසී ගොස් ඇති මේ කාලය තුළදී අප සැබෑ වූ එතරවීමකට නැතිනම් සැබෑම ජීවිත වෙනසකට අප අවතීර්ණ විය යුතුය.

මෙසේ අපගේ ජීවිත වෙනස් කර ගැනීමට අප කැඩී බිඳී පොඩිවී, නැවත ශක්තිමත් විය යුතුය. අප මේ ගත කරන අන්ධභාවයෙන් මිදිය යුතුය. එවිටයි අපට හැකිවන්නේ අපගේ ජීවිත සැබවින්ම වෙනස් කර ගැනීමට. කිතුනුවන්ගේ ජීවිත ගමන කුරුසියයි. අපට කුරුසියක් නොමැති නම් අප තුළ කිතුනු ජීවිතයක් නැත. අපට පැමිණෙන දුක් කම්කටොළු, කරදර, අසහන ප්‍රශ්න හමුවේ අප ශක්තිමත් වන්නේද, අප දරාගත යුත්තේද අපගේ පවු බරින් බරවූ කුරුසියයි.

එසේනම් අප සැබෑ එතරවීමකට සූදානම් වෙමු. සැබවින්ම වත ඉරාගෙන නොව සිත ඉරාගෙන දෙවි සමිඳුන්ට වඩ වඩාත් ළං වෙමු. එහෙයින් කිතුනු ජීවිතයේ සතුට තෘප්තිය ළංකර ගැනීමට සැබවින්ම මෙම චතාරික සමය තුළදී එක් අයකු හෝ එතරකර ගැනීමට අදිටන් කරගමු. එවිට සියලුම දෙනා එතෙරවනු ඇත. ඔබ සියලුදෙනාටම සුබ පාස්කු මංගල්‍යයක් වේවා!

ජේසු පිහිටයි.

**ශාන්ති ජම්බුගේ මිය.**
මහනුවර පදවියේ වසර 36ක සේවයක් කරන ධර්මදූත ළමා සමිතියේ සජීවිකා සහ වසර 36ක දම්ගුරු සේවය කරන කටුගස්තොට මීසමේ

## චතාරික කාලය

දෙවියන් වහන්සේ සියලු මිනිස් වර්ගයා උදෙසා ලෝකය මවා එහි ඇත්තා වූ සියලු සම්පත් මිනිසා ගේ යහපත සඳහා දී ඇත. එහෙත් මිනිසා ගේ අහංකාර කම්නුත් උඩගුවෙනුත් දෙවියන් වහන්සේ ට අකීකරු වී දේව දරුකමට පිටු පා ජීවත් වීමට යාමෙන් මිනිසා දේව උදහසට පත් වී ඇත.

මේ නිසා පුත්‍ර වන දෙවියන් වූ ජේසුස් ස්වාමි දරුවන් මේ ලෝකයට පැමිණ බෙත්ලෙහෙම් නුවර උපත ලබා අවුරුදු 33ක් ගත කර තම කුරුසිය යාගය තුළින් නැති වී ගිය දෙවි මිනිස් සබැඳියාවට නව පණක් ලබා දී ඇත.

කෙසේ වුවත් ක්‍රිස්තුස් ස්වාමි දරුවන් ගේ දුක්ප්‍රාප්තියත්, ශ්‍රී මරණයෙන් පිං හේතු උදෙසා සියලු මිනිස් වර්ගයා ගැලවීම ලබා ඇත. කෙසේ වුවත් ජේසුස් ස්වාමි දරුවන් උන්වහන්සේ ගේ ශ්‍රී ශුද්ධ වූ දුක්ප්‍රාප්තියේ දී දින හතළිහක් පාලුකරයේ වන ගත වී ගත කර ඇත. සියලු මිනිස් වර්ගයා ගේ පාප වලට උන්වහන්සේ මනස්ථාපනයෙන් පිතාවන දෙවියන් ට යාච්ඤා කර ඇත. චතාරික කාලයේ අපත් සියලු මිනිස් වර්ගයා උදෙසා බැහැපත්ව දයා ප්‍රේමයෙන් යාච්ඤා කරමු.

**එන්.ඩබ්.පී. පෝල් පෙරේරා**
තෙන්නකෝන් මාවත, ගයියාල, කුලියාපිටිය.



# මරණය පරදා නැගී සිටිමු

අළු බදාදා දින ආරම්භ කරන කොරොස්ම කාලය හෙවත් චතාරික කාලය අපව යොමු කරන්නේ පාස්කු අභිරහස හෙවත් දුක්විඳීම, මරණය, උත්ථානය වැනි ඉතාමත් හාස්‍යය ජනක සිදුවීම සිහිපත් කිරීමයි. ජනවන්දනාව තුළ මේ උතුම් වූ පාස්කු අභිරහස සෑම ඉරිදා දිනකත්, සෑම දිව්‍ය පූජාවකදීත් සිහිගන්වනු ලබයි. ප්‍රසාද ස්නාපනය ලැබූ අප සියලුම දෙනා එහි පංගුකාරයෝ වෙති. මෙවැනි සිද්ධියක් එදා සමාජයේ සිදු නොවුනානම් අප තවමත් අපගේ පාප තුළම ජීවත් වනු ඇත. එසේ නම් අපගේ දේශනා කිරීම සහ ඇදහීම නිරර්ථක වනු ඇත.

කතෝලික සභාව ඉදිරියට යන්නේද ජේසුස් වහන්සේගේ මෙම උත්ථානය නිසාය. එහි සදාතනික සත්‍යය නිසා කිතු දහම ලොව පුරා විසිරී පැතිරී ඇත. අපගේ පාප වලට වන්දි ගෙවීමක් ලෙස මහෝත්තම වූ දෙවි පියාණන් වහන්සේ මෙලොව මාංශගත වීමට සලස්වා මිනිස් ජනතාව පාපි බවින් මුදා ගැනීමට කුරුසියේ මරණයට පත් කරන ලද්දේය. කිසිදු පාප කිළුටක් නොමැතිවූ උන්වහන්සේ දේව අභිමතයට පිටුපා මිනිසකුට විඳීමට තරම් නොහැකිවූ කායික හා මානසික වේදනා විඳ දරා ගත්තේ කොතරම් ඉවසිලිවන්තවද, උන්වහන්සෙගේ සිතේ ඇතිවූ බිය අප ශුද්ධවූ ලියවිල්ල තුලින් දැනගන්නෙමු. එමනිසා මුළු ලෝකයටම ආදරය දැක්වූ කිතු සමිදාණන්ගේ උත්ථානය සමරන අපි අපගේ ජීවිත ක්‍රමය වෙනස් කරගෙන සැබෑ මනස්ථාපනයකින් යුතුව එතෙර වීමකට අප මේ පාස්කුව තුළදී උන්වහන්සේට පොරොන්දු වෙමු.

ඔබ සියලුදෙනාටම අර්ථවත් පාස්කු මංගල්‍යයක් වේවායි ප්‍රාර්ථනා කරමු.

**ජේසු පිහිටයි.**

**ගරු කේ.එල්.ලෙස්ලි පෙරේරා පියතුමා**
මහනුවර පදවි ජනසන්නිවේදන කේන්ද්‍රීය අධ්‍යක්ෂක

# යළි කුරුසෙට යවනු එපා

කිතු සමිඳා දුගියකු සේ
ඉපිද එදා ගව මඩුවේ
ලොවට විමුක්තිය දෙන්නට
දිවි පිදුවා කුරුස ගසේ

එවන් රුදුරු දුක අපගේ
සිතින් මැකී ගොස් මෙකලේ
දනෝ ගිලෙත් පව් අඳුරේ
අපා දොරටු දසත පෙනේ

වංචා දූෂණ බෝ වී
දෙව් පෙම සිඳ මත් රසයේ
වහලුන් වී ලොව කළඹා
සියතින් සිය ගෙල සිඳිතී

සත් මග සුර පෙම පෙන්නා
පාප දොරටු අගුළු දමා
කුරුසෙට බිලි වූ සමිඳා
යළි කුරුසෙට යවනු එපා

උත්තම රුහිරේ අනුහස්
අමතක කොට "ජුදාස්" මගේ
ගොස්, අප ගැල වූ උතුමා
යළි කුරුසෙට යවනු එපා

**චාමර හෙට්ටිආරච්චි සහෝදරතුමා**



# ජේසු කතා කරයි

පෑරස බොජුන් තිබුනත් ඔබ නිවස පුරා
කෑමට යමක් දී නැහැ කුඹියෙකුට ද කුරා
නෑ නෑ කියා යාචකයන් පෙලුව තුරා
යෑමට වෙයිද මට යළි කුරුසියක් දරා

පාවිලි බියෙන් යැදූ වත් ඔබ හද වතට
කාහල කලත් නොලැබුණි ප්‍රතිඵල ගතට
තා වැලපුනත් මා අභියස හැම අතට
මා ගෙන ගියේ ඔබමයි කුරුසිය මතට

කරුමය නිසා මා ලෙඩ ඇඳ සිටින විට
අරුමය මා නුදුටුව ලෙස ගියා පිට
දරුමය ඒක නම් ඔබ තුල දරා සිට
උරුමය වේද මට යළි කුරුසයක පිට

යාගත නොහැකි පා වාරුව නැතිව මම
සාගතයකට නතුවී සිටියේ මිය ගම
පා සෙවනකි ඇසුනි සතුටක් දැනුනි අම
මා දුක පෙණුණු ඔබ නොකියම ගියා නම

කරුණා දයා සෙනෙහස ඒ මහඟු ගුණේ
අරුණාලෝකයෙන් හද තුල තබනු මැනේ
පිරුණොත් ඔබේ ඊරිසියා වෛර ගුණේ
කරුමය මගෙයි යළි කුරුසෙක බරක් දැනේ

කේලම් මුසාබස් ගෙන හිත කෙටවීම
දියුණුව ඉදිරියේ උගුලක් ඇටවීම
කරනා වැරදි වෙනකෙකු පිට පැටවීම
දෙවියන් කොහිද ඔබහට නැත වැටහීම

**ඩී. ලීනස් චන්ද්‍රසේකර කිරිහෙට්ටි**
විශ්‍රාමික හෙද නිළධාරී
නො 96, දුන්ගාල්පිටිය, මීගමුව

# දැහැන්ගතවී පසුතැවිල්ලට

සසල සිත කය නිසල කරමින් ජීවිතය යළි පන නගන්නට
පාපයේ අවගති නසන්නට දිවිගමන සුමඟට යොමන්නට
නලලතේ අළු තවරගමින් අතීතය ගැන සිහි කරන්නට
චතාරික සමයේ දැහැන්ගත වෙලා පත්වෙමු පසු තැවිල්ලට

පවට බරවුණු අපේ ජීවිත යළිත් උඩු යටිකුරු කරන්නයි
පරීක්ෂාවෙන් ජයලබා යළි ජීවිතය සවිමත් කරන්නයි
දින හතලිහක කටුක දිවියක් ගෙවූ ජේසුස් වෙත හැරෙන්නයි
නපුර පරදා ජය ලැබුව සැටි ජේසු දිවියෙන් අත්දකින්නයි

වනාන්තරයේ දින හතලිහක් නිරාහාරව ජේසු සිටියා
පිපාසය බඩගින්න හමුවේ සැලුනෙ නැත දිරිමත්ව සිටියා
නියම කල්යල් බලා ජේසුව වට්ටවන්නට යක්ෂ පැටියා
පෑ රැඟුම් සැම නිරර්ථක විය ජේසු සවිමත් ලෙසට සිටියා

අපේ ජීවිත ගමන කටුකයි නැගෙන බාධක අපමණයි
නපුරෙ බලයට වැටෙන කඩඉම් හමුවෙ අප සැම අසරණයි
සැනසුමක් නොපෙනෙනා තරමට අඳුරු සෙවනැලි මඟවසයි
මෙවන් විටදි යක්ෂ මායම් අපේ දිවියට අතවනයි

මෙලොව ජීවිත රඟමඩල තුල ලබා ජය සැම පරදමින්
හොඳ පසෙකලා නොහොඳෙ ගැලිලා විනාසෙට පිය ඔසවමින්
දිවිය අනියත බව නොසිතමින් තාවකාලික සැපතෙ වෙලෙමින්
ගෙව්වොතින් ජීවිතය සිදුවේ වන්දි ගෙවුමට කඳුළු සලමින්

මුළු වසර තුළ කෙරුව අවගුණ සිතා අඩමින් වැළපිලා
ජීවිතේ වෙනසක් දකින්නට පසු තැවිල්ලට වලබිලා
ඉදිරි දිවි මඟ පල ලබන්නට දැහැමි ගමනක් අරඹලා
ජේසු ගිය මඟ යන්න අදිටන් කරමු බිය සැක දුරලලා

**බෙනී ජයමාන්න**
සා.ජෝසප් දේවස්ථානය, පමුණුගම

# ජේසු ඔයාට

නිරුවත් සිරුර කස පහරේ
ලෙයින් හැඩකොට
වේදනා දුක දැනුනේ
පාපයේ වස්ත්‍ර ඇඳි හිත් නිරුවත් කරන්න.

හිසකෙස් අතරින්
හිස් කබල මැදටම
උල් කටු ඇනී සිරවුණේ
පාපයේ හිස සිඳ දමන්නට

වැටි වැටීත් මඟ දිගේ
බර කුරුසේ කර දරා
කල්වාරි පුදසුනේ
පිදුනේ මකන්නට පව් ලෝකයේ

ඇඳිවතත් ඉවත් කර
ලැජ්ජාව පැළඳගෙන
නිහඬ වී ඉඩ දුන්නේ
වටිනාකම පෙන්වන්න ඔබ මට

ඇණ පහර තදින්ම
අත පසාරු කර කුරුසියට
තදින්ම බැදුණේ
මුදවන්න පාපයට තදින්ම වෙලුන සිත්

කෲරතම මරණය
නින්දිතම කුරුසියේ
සිප වැළඳ එල්ලුණේ
ආදරේ මහා ගැඹුරු මහිමය පෙන්-වන්න

**බී.කේ. මාලින්ද එරෝෂණ රුදිගු**
දලුගම මීසම

# කල්වාරිය පාමුල සිට

යන එන මග හැමදා මම මහ පල්ලිය දකිනවා
ඉරුදින හැමදාකම මම ජේසුව ලැබ ගන්නවා
ඉපදුන දා සිට මෙහි පල්ලිය බිම වඩිනවා
අම්මා තාත්තා හැමදා එය මට හුරු කරනවා

පල්ලිය වත්තේ පැත්තක කල්වාරිය දකිනවා
ජේසු මහ කුරුසියක් කර ගහගෙන ඉන්නවා
කල්වාරියේ කන්ද තවම මම හැමදා නගිනවා
එදා ජේසු කොහොම නැග ගියාද මමම ප්‍රශ්න කරනවා

මැදින් මාසෙ වෙනකොට මෙහි මහ සෙනගක් ඇදෙනවා
ලොව පුරාම සියලු දෙනා ජේසුගේදුක සිහි කරනවා
එදා කොහොම නැග ගියාද ඉඳ හිට මට සිතෙනවා
අනේ මටත් බර කුරුසිය කර ගහන්න සිතෙනවා

කස පහර කකා ලේ පෙරාන මහ ගව්වක් දුර ගියේ
යන මග තොටේදීම ජේසු අම්මා සම්බුණේ
එදා කොහොම දැනෙන් ඇත්ද තම පුතාගේ දුක අනේ
මහ යෝධයෙක් වි යන්න ඇත්නම් අරගෙන කුරුසිය අනේ

මෙය බලන්න මහ සෙනගක් එදා දෙපස රැස් වුණේ
කවුරුත් නෑ අතගහන්න තනියම නගිනවා අනේ
ඔහොම ඔහොම දුර නගිද්දි කවුරුන්දෝ ඇත පෙනේ
සිරේනියේ සීමොන් ඔහු තමයි විගස පැමිණියේ
මහ හයියක් අපෙ ජේසුට දැනුනා නිසැකයි අනේ
තව තියෙනවා දුර නගින්න මිනිසුන් වෙනුවෙන් සහේ

සුදු රෙද්දක් අත දරාන කවුරුන්දෝ මග දිගේ
ජේසු වෙතට ළං වෙනවා ළාවට ජේසුට පෙනේ
වෙරෝනිකා නම් ස්ත්‍රියක් ශ්‍රී මුහුණම පිසලුවේ
ලේ ගලන මුහුණ පිසදාමින් ජේසුට සහනය වුණේ


බිම වැටි වැටි ජේසු තවම නගිනවා කල්වාරියේ
වස්ත්‍ර කඩා දාදු දාන්නට සැරසෙනවා නඩේ
ජේසු එදා අප වෙනුවෙන් පෑ සෙනෙහස කුරුසියේ
ඇණ තුනකින් එල්ලීගෙන කුරුසියේ ඉන්නවා පෙනේ

කල්වාරියේ පාමුල සිට ජේසු එක්ක ආයෙමත්
නැග යන්නට ඇත්නම් මට
මම ජේසුට උදව් වෙනවා මගේ උපරිම ශක්තියෙන්

**ඒ. ශෙහානි නිමේෂියා**
වික්ෂෝප දේව මාතා දේවස්ථානය,මාවතගම



# නියම කිතුනුවකු ලෙස... අරුත්බර චතාරිකයකට...



අළු බදාදා නළලේ අළු තවරාලා
දූවිල්ලෙන් උපන් බව මතකෙට නගලා
දූවිල්ලට නැවත හැරෙනා බව සිහිකරලා
චතාරිකය වැළඳ ගනිමු කළ පව් ගැන පසුතැවිලා


නිරාහාර ශීලය රැක දන් දෙන්න
ගැඹුරු යාච්ඤාවෙන් දෙවිඳුන් යදින්න
හොඳ පව් සමාවක් ලැබ දෙවිඳුට ප්‍රියවන්න
අරුත්බර චතාරිකයක් උදව් වේවි ඔන්න

චතාරිකයේ පමණ ද මේ දේ කරන්නේ
ඉන්පසු සියලු දේ අමතක වී යන්නේ
සෑම දාම මේ ලෙස දිවි ගෙවමින්නේ
සැබෑ කිතුනුකම ඔබගේ රැක ගන්නේ

ගැඹුරු යාඥාව හා දානය දීම
නිරාහාර ශීලය ඉඳහිට රැකීම
පාපොච්චාරණෙන් දෙවිඳුට ළංවීම
කළොත් ගෙවෙයි චතාරිකය කිතුනුවකු ලෙස නියම

**ඩිලීෂියා තිලකරත්න**
දහම් ගුරු
ශාන්ත මරියා දහම් පාසල කෑගල්ල

# පායනු මැන මනු හද පත්ලේ



කුලුණු දයා පෙම අප දුටුවේ
ඔබ ගෙනි සුර පුත් කිතු සමිඳේ
සව්සත වෙනුවෙන් දිවිය පුදා
ඔබ විඳි දුක් කඳ ගැන මතකේ
අද හිරු දුටු තුසර බිඳක් සේ
මනු සිත් හී සිඳී ගොසින්....

නිමල ඔබේ පෙම දුබල දනෝ
නොතකා අව ගුණ කරති, වගා
නොමිනිස් ගති හද උඩු දුවමින්
මතින් උමතු වී ලොව නසතී
අන් අය හට වළවල් කපමින්
උදම්වෙලා ඒ මත රඟති...

ළිප ගිනි මොළවන තුරා මෙසේ
අහෝ සැපකි සිතමින් මේ දන
කකුළු රැඟුම් දෙති රිසි සේ
දම් මග හෙළි කොට දිවිය පිදූ
ඔබ ගැන මතකය සිතින් මැකී
අද පව් අඳුරේ ගිලී ඇතේ

පින්වත් ඔබ යළි කුරුසියට යවා
සාතන් මෙහි රජ කරවන්නට
රඟ දෙන මේ පවිටු දන කැලගේ
සිත් ගනඳුර සිඳිනා තෙදබල
හිරු මඬලක් වී දිමුතු රුවන්
පායනු මැන මනු හද පත්ලේ

**චාමර හෙට්ටිආරච්චි සහෝදරතුමා**



# මමත් මවකි පුතුනේ.

කිරි සුවඳ දවටාලා
නුඹේ ටිකිරි සිනා බල බලා
සතුටු වුණෙමි ... මේ අම්මා

අඩි දෙක තුන පය ගසා
චූටි මගේ පුතු ... වැටී වැටී යන විට
මගේ පුතු නොහඬන්නට
මගේ පුතු නොරිදන්නට

නුඹේ අම්මාගේ දෑස ... නුඹ ළඟම තබා

අප නුඹ රැක්කේ
එලෙසයි පුතුණේ ...

බෑ අසන්නට ... බෑ බලන්නට
අවමන් කළ වචන අතර
ලේ දහඩිය වගුරුවමින්
වැටි වැටී නුඹ
උණුසුම් පොළෝ මතින්
පය තබා යන
කල්වාරී පාමුල තෙක්
අම්මෙක් කෙලෙසද
පිය නඟන්නේ?

ඒ කඳු මුදුනට කුරුසියද දරා
මේ ඇස් මායිමේ
වැටී වැටී ගමන් කළ පුතු දෙස
එදා මෙන් අදත්
මා නෙත් නුඹ ළඟම තබා
පසු පසින් පැමිණියද

අද මා රකිනුයේ කෙලෙසදැයි
ළත වූ සිතද සමඟ
අප පුතු නොයෙන ගමනක් නොවේවායි
සිත සිතා බල බලා
බලාපොරොත්තු පොදි බැඳන්
මේ අම්මා

තැවී පොඩිවී හදවත ඇවිලී
මසිත නොමරා මැරී මැරී ජීවත්වූයේ

මමත් මවකි පුතුනේ ...

**ඩබ්. අචිනි නිර්මලා ප්‍රනාන්දු**
කඳවල, කටාන

# එතකොට වැඩියි පමා


ඇස් නැති සේ දුර නොදකින
සිත් නැති සේ වල්මත් වන
අන් අය පාගා ගිනි දී
යසිසුරු පවසින් අද දන
කොහෙදෝ යන්නේ...

බමන මතින් පව් නොපෙනේ
ඉසි කෝ වෙර හදේ පිරේ
ගිනි ගත් සහරාවක් සේ
මුදු ගුණ මනු සිත අද කෝ?
සාතන් රැඟුම් දෝ මේ...

වියළි කතරේ දිය නොරැඳේ
කිතු පෙම මනු හද එලෙසයි
සුර ලේ ගැලුවත් ලොවට පෙමින්
අද නර සිත් සමිඳු යළි
කුරුසෙට යවනු පෙනේ..

දෙව් තිළිණෙකි සොබා දමත්
නර අවගති නොම ඉවසා
එය වියරු වැටෙන විටදී
එතකොට දෙවියන් සිහිවේ
එතකොට වැඩියි පමා

**චාමර හෙට්ටිආරච්චි සහෝදරතුමා**



# ශ්‍රී කුරුස පුදබිමක..

05 පිටුවෙන්..

ස්වාමීන් වහන්සේට බාරදෙති. මෙම චතාරික සමයේ ද බොහෝ බැතිමතුන් එම ප්‍රතිමාව ළඟ දනින් වැටී භාවනාවේ යෙදෙති. බොහෝ කල් ගතවී ක්‍රි.ව 1963 දී ඇන්තනී ධර්මරත්න (නි.ම.නි) පියතුමා වින්සෙන්ති නිවාසයේ කළමනාකාර අධ්‍යක්ෂ තනතුරට පත්විය. එම පියතුමා එතෙක් දිරාපත් වෙමින් පැවති ලී කුරුස ඉවත් කළේය. බැතිමතුන්ගේ පරිත්‍යාග ලබාගෙන කළුගල් යොදා කුටි තනා පියස්සද ස්වභාවිකව නිමවා ඇත. එම කුටි ගර්භයෙහි ජීවමාන ලෙස පෙනෙන බදාමයෙන් නිර්මිත මූර්ති තනවා එම ප්‍රතිමා ස්ථාපිත කරන ලදී. ජෙරුසලමේ ඇති පාද නමස්කාර ස්ථාන අනුකරණය කරමින් මග්ගොන කල්වාරිය නිර්මාණය කර ඇත.

### ප්‍රාතිහාර්යාත්මක ලූර්දු නිවහන

පළවන පාද නමස්කාර ස්ථානය පසුකර බෑවුම කරා පිවිසීමේදී ලූර්දු මාතා ගුහාව හමුවේ. එහි පුරාණයේදී මෙලෙස සනිටුහන් වී ඇත. ක්‍රි.ව 1910 -11 පමණ කාලයේදී මග්ගොන ග්‍රාමය පුරා බෝවන රෝගයක් පැතිරී තිබුණි. එවකට කළමණාකාර අධ්‍යක්ෂ චාල්ස් ක්‍රොන්ඩ්‍රඩ් (නි.ම.නි) පියතුමා දේව මාතාවන්ට භාරහාර වෙමින් අයැද සිටියේ රෝගය ග්‍රාමයෙන් තුරන් කරන පිණිස ය. වසරක පමණ කෙටි කාලයකින් එම රෝගය තුරන් විය. එලස සිදුවූ ප්‍රාතිහාරයට දේව මාතාවන්ට ප්‍රශංසා කරනු වස් ක්‍රි.ව 1911 දී එම ලූර්දු ගුහාව ස්ථාපිත කර ඇත. ප්‍රංශයේ ලූර්දු නුවර සිද්ධස්ථානය අනුකරණය කරමින් එම භූමියේ ම ස්වභාවිකව පිහිටා ඇති විශාල කළුගල් පර්වතයක ලූර්දු ගුහාව නිර්මාණය කර ඇත.

### ආශිර්වාදිත ලිඳ

ලූර්දු ගුහාව ඉදිරිපිට ළිඳ පිහිටා ඇත. පැරැන්නන් පවසන්නේ රෝග සුව කර ගැනීමට එම ළිඳේන් ස්නානය කිරීම සුදුසු බවය. ඉතාමත් සිසිල් දිය උල්පත් සහිත එම ළිඳෙන් ස්නානය කිරීම සුදුසු බවය. ඉතාමත් සිසිල් දිය උල්පත් සහිත එම ළිඳෙන් ස්නානය කිරීම ආශිර්වාදයක් ලෙස පැරැණි ගැමියන් සැලකූහ. ක්‍රි.ව 1800 පමණ කාලයක සිට පැවත එන භූගත සොහොන් කුටි මහා කුරුස ප්‍රතිමාවට පසුපස දෙසින් පිහිටා ඇත. එම සොහොන් කුටි ප්‍රැන්සිස්කානු සහ නිර්මල මරිය නිකායේ මිෂනාරිවරුන්ගේ දේහ තැන්පත් කළ ස්ථානයන්ය. ඉහළ සිට පහළට සිරස් ආකාරයේ ලාච්චු අදින ලෙස එම සොහොන් ගෙවල් නිමවා ඇත. එය ඉතාලියානු සම්ප්‍රදායේ ජාතික මග්ගොන කල්වාරි පුදබිමේ ආකර්ෂණීය ස්ථාන බොහෝය. ගොතික් සහ රෝමානු ගෘහ නිර්මාණ ශිල්පයට අනුව ගොඩනගන ලද ඉපැරණි දෙව් මැදුර තවත් විශේෂ ස්ථානයකි. ක්‍රිස්තුස් වහන්සේ වේදනා බරව යාච්ඤා කළ මල් උයන වැනි සුන්දර අධ්‍යාත්මික ස්ථාන බොහෝය. ක්‍රිස්තු වර්ෂ 2008 වසරේදී රජයේ ගැසට් පත්‍රය මගින් මෙම කල්වාරි භූමිය ජාතික සිද්ධස්ථානයක් ලෙස නම් කර ඇත. චතාරික සමයේ එම ස්ථානයේ කෙරෙන වැඩකටයුතු සඳහා රාජ්‍යය ආයතන බොහෝමයක් සම්බන්ධ වේ. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ සහයෝගයද මෙම පුණ්‍ය භූමියට ලැබෙනු ඇත.

# 2023 දූව පාස්කු අසිරිමත් සැමරුම

## දූව ඓතිහාසික පාස්කු සැමරීමේ විශේෂ අවස්ථා

ක්ලෙමන්ට් ප්‍රනාන්දු
නිර්මාතෘ හා සභාපති - දූව සෞන්දර්යය රංග කේන්ද්‍රය













# පසමට පෙම් බැන්දෝ ප්‍රාතිහාර්යය අත්දැක්කෝ

11 පිටුවෙන්

> හා හා පුරා කියා දේව නමස්කාරයෙන් සලාපුරෙන් ආරම්භය ගත් අපි මී පුර පසුකර දක්ෂිණයේ ද වැඩ අවසන් කර හමාර ය. ඊ ළඟ " ඇ..ක්...ෂ...න්...." කියන්නට වහකෝට්ටේ බලා සිටී. දක්ෂිණයේ නොනැවතී වහකෝට්ටේ වැඩට අතගහලා උතුරට යන්නයි අපේ අනාගත සැලසුම.

පසම් තෝරා ගැනීම අතිශයින් මහත් සංයමයකින් සහ පරිශ්‍රමයකින් කිරීමට දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ගත් ව්‍යායාමය අතීශයින් ප්‍රශංසනීයය.

අපගේ පළමු කාර්යය වූයේ දක්ෂිණයේ සියලුම කණ්ඩායම් එකතු කරමින් ඔවුන් හට ධර්ම විවේකයකින් ධාර්මික ආරම්භයකටය. එය කෙටි වුව ද ජීවිත ස්පර්ශ කරන්නක් විය. එහෙත් බාධක නම් එමට තිබිනි. තාක්ෂණ බාධා, සන්නිවේදන බාධා, එකී නොකී බාධා පරයා අප ධාර්මික ආරම්භයක් ගන්නට අවසානයේ පොහොසත් වූවා ය.



රූගත කිරීම ලංවී තෙදිනක ට පෙර නාඋතු කන්ද නැවත නිරීක්ෂණය සඳහා ප්‍රධාන කැමරා ශිල්පීන් සහ කලා අධ්‍යක්ෂ කැඳවා මම ගියෙමි. සියල්ල අවසාන ය. කන්ද මත කුරුසියක් සිටුවීම සඳහා මුළු ප්‍රදේශය ම ඩෝසර් කර හමාර ය. "අයියෝ" කියා කියවුනේ දිග සුසුමක් සමග හූල්ලමිනි. අප පෙර දිනක ගිය පටු මාර්ගය සම්පූර්ණයෙන් වසා තිබිනි. එතනින් යාමට තියා සිතීමට බැරි ය. අප පෙර දින නිරීක්ෂණය කොට ස්ථිර කරගත් පසුතල සියල්ලට දෙවියන්ගේ පිහිටය. කැලයක් කපා කුරුසියක් හිටවා ඇත. එය කුරුසයට ගිය ජේසුට කොහොම දැනෙන්නට ඇද්ද කියා අපි නාඋතු කන්දෙන් බැස්සේ එකී පසුතල වලට තිත තබමිනි.

දක්ෂිණයේ භූගෝලීය පරාසය ඇතුලේ කළුතර ආශ්‍රිත ව ගම්මාන අටක් සහ හුදකලාව වුව ද ගාල්ලේ නියෝජනය ද අනෙකෙකුට දෙවෙනි නොවී ය. පසම් හා ලතෝනි ගායනය පැවති මට්ටමේ සිට අවසාන මට්ටම දක්වා මට්ටම් කිරීම අතිශයින් ම දුෂ්කර කාර්යයක් වූවා ය. එය චතාරිකයේ ම සිදු වූ බැවින් ඒවා සියල්ල ම චතාරික මර්ධන ක්‍රියා ලෙස අවසානයේ මා එයට බැර කරන ලදී. අතීශයින් ම බාධක මැද්දේ ආ ගමනක් වුව ද දැන් එය දකිනුයේ අතීශය සුන්දර අත්දැකීම් පොකුරක් අප ජීවිත වලට එකතු වී ඇති බව ය. දෙපාර්තමේන්තු අධ්‍යක්ෂවරිය ඇතුළු සෙසු කණ්ඩායම මුළු වැඩේ ම මා සමග සිටියේ සීරුවෙනි. එයට හේතුව ඉලක්කයක් ඔස්සේ යන ගමනක දී ආඥාදායකයෙකු සේ දැඩිවත්, හැඟිම් ගණුදෙනු වල දී සුන්දරවත් යෑමට විම ය. ඔවුන්ගේ වචනයෙන් ම කිවහොත් "සැරයි, ටිකයි". හරියට සුන්දර ආඥාදායකයෙක් ලෙස ය.

අතීශයින් ම එය අති දුෂ්කර කාර්යයක් වූයේ ඉතා කෙටි කලක් ඇතුලත සියල්ල සැලසුම් කිරීමට වීම ය. එක් පෝයකින් ආරම්භය ගත් අපි දෙවෙනි පෝය රූ ගත කිරීම් සිදු කර තෙවන පෝය ලබන්නට මත්තෙන් එකී නිර්මාණය ජනතා සන්තක කිරීම අපගේ අභිලාෂය විය. එය සැබවින් ම මට නම් ප්‍රාතිහාර්යකි. එය සලාපුරේ, මීපුරේ නොව දක්ෂිණයේ පමණක් සිදු වූවකි.

පසම් ගායනයේ යෙදු වැඩි බහුතරයක් දෙනා කාන්තාවන් ය. ඔවුන්ගෙන් බහුතරයක් වයසින් මුහුකුරා ගිය බවලත් උදවිය ය. රූගත කිරීම සඳහා දින තුනක් පෙබරවාරි මස 23,24,25 වුව ද අපිට නම් ඒ දින තුන එක ම දිනයක් සේ විය. මන්ද පැය තුන හතරක විවේකයකින් නැවත වැඩේටම ය. රූගත කිරීම් අවසන් වූයේ පැය 27ක් දීර්ඝ මෙහෙයුමකිනි. කාලය එසේ ගෙවී ගිය ද අපට එය නොදැනුනේ මූලික කාර්යය තුල අපි හැමෝ ම නිවැරදි ව නොවෙනස් වී සිටි නිසා ය.



මහා පාන්දර වැඩේට බැස්ස අපි පැය 27ක් එක දිගට එක එල්ලේ එල්ලි සිටිය ද කිසිම කන් කෙඳිරියාවක් ඇසුනේ නැත. අනේ බෑ, දැන් අපිට අමාරුයි, දැන් ඇති, .... මේ කිසිවක් ඇසුනේ නැත. අවුරුදු 80 අවුරුදු 90 ආච්චිලා සීයලාගේ දැඩි අධිෂ්ඨානය දරා ගැනීම නොසැලී සිටි මා සසල වූ අභියෝගාත්මක අත්දැකීම් අතර ඉහලින් ය. එයට මාගේ නමස්කාරය ඔවුනට ලෝබ නැතුවම ය.

නිර්මාණයට දායක වූවෝ ද තාක්ෂණයෙන් දායක වූ ශිල්පියෝ ද මා සමග සිටියේ සීරුවෙන් ම ය. ඒ ඔවුන් මා සමග නිරන්තර වැඩ වල දී ඔවුන් ලද පසුගිය අත්දැකීම් වල හුරුවෙනි.

එය ඔවුන්ට අතිශයින් ම සුන්දර වූ අත්දැකීම් සමුදායකි. සිහිනයකි. ඔවුන් ට කිසිදා එය අමතක නොවනු ඇත.මොන දේ අමතක වුව ත් මාගේ සුන්දර ආඥාව නම් අමතක නොවන බව පැවසුවේ මාගේ වචනයෙන් ම කථා කරමින් " වන්, ටූ ත්‍රී ෆෝ වන් ඇ..ක්...ෂ...න්...." හරියට ම උෟරගෙ මාළු උෟරගෙ පිටේ තියා කපන්නා වැනි ය.

හා හා පුරා කියා දේව නමස්කාරයෙන් සලාපුරෙන් ආරම්භය ගත් අපි මී පුර පසුකර දක්ෂිණයේ ද වැඩ අවසන් කර හමාර ය. ඊ ළඟ "ඇ..ක්...ෂ...න්...." කියන්නට වහකෝට්ටේ බලා සිටී. දක්ෂිණයේ නොනැවතී වහකෝට්ටේ වැඩට අතගහලා උතුරට යන්නයි අපේ අනාගත සැලසුම. ඒ සියල්ල දෙවියන්ට බාර දීලා, වෙච්ච හොඳ නොහොඳ ඔක්කොම දෙවියන් බලාගත්තාවේ කියා මං නවතින්නම්.



ඒ සියල්ල ම සිදු වූයේ දෙව් මහෝත්තමයාණන් වහන්සේගේ ම අනුග්‍රහයෙනි. සිදු වූ යහපත් සියල්ලේ ම මහිමය උන්වහන්සේට ම ය. එය එසේ හමාර විය.